**සැ.යු.**: මෙවර පළවන *ගැසට්* පත්‍රයේ II වැනි කොටසේ 2026 වර්ෂය සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,503 - 2026 අගෝස්තු මස 21 සිකුරාදා - 2026.08.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු … … | - | විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … … … | - |

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 සැප්තැම්බර් මස 11 දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 අගෝස්තු මස 28 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

0000 - B 82823 - (2026/08)
E - 01

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපෙදස්

*සැ. යු. :*"මින්පෙර පළ වූ ගැසට් නිවේදන සියල්ලෙහි ම සඳහන් විභාග අපේක්ෂකයින් සඳහා නීති හා උපදෙස් යන මැයෙන් පළකරනු ලැබූ නීති හා උපදෙස් මාලාව මෙමගින් අවලංගු කරනු ලබන අතර මින් ඉදිරියේ දී බලපවත්වනු ලබන්නේ මෙම ගැසට් පත්‍රයේ පළකරනු ලබන නීති හා උපදෙස් මාලාවයි."

2026 ජූලි මස 22 වැනි දින,
ඒ. කේ. එස්. ඉන්දිකා කුමාරි ලියනගේ,
විභාග කොමසාරිස් ජනරාල්.

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ථ"

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාව

### ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ ශිල්පීය අංශයේ නාවිකයින් සඳහා පුරප්පාඩු

1. ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ ශිල්පීය අංශවල ආධුනික නාවික ශිල්පීන් සඳහා පුරප්පාඩු පවතින අතර, පහත සඳහන් සුදුසුකම් ඇති පිරිමි අයදුම්කරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවට බැඳීමට පහත සඳහන් පොදු කොන්දේසි අනිවාර්යයෙන්ම සපුරාලිය යුතුය.

| | | | |
|---|---|---|---|
| (අ) | පුරවැසිභාවය | - | ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය. |
| (ආ) | වයස | - | 2026 සැප්තැම්බර් මස 15 වන දිනට අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 24 ට නොවැඩි විය යුතු ය. (අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට) |
| (ඇ) | උස | - | 5' 5" (සෙ.මී 165.10) |
| (ඈ) | ශරීර ස්කන්ධ දර්ශකය | - | 17-27. |
| (ඉ) | පපුව | - | 32" (සෙ.මී 81.28). |
| (ඊ) | වර්ණ දර්ශනය | - | එස්ටීඩී II |
| (උ) | දුර දර්ශනය | - | 6/6 (උපැස්/ අක්ෂි කාච රහිතව) (6/12 දෘෂ්ටි තීක්ෂණත්වය උපැස් මගින් 6/6 දක්වා නිවැරදි කර ඇති අයදුම්කරුවන් සලකා බැලිය හැක). |
| (ඌ) | සිවිල් තත්ත්වය | - | අයදුම්කරුවන් අවිවාහක විය යුතුය. කිසිම ආධුනිකයෙකුට පුහුණුව ලබන කාලයේ දී විවාහ ගිවිස ගැනීමට අවසර දෙනු නොලැබේ. |

2. **බඳවාගනු ලබන අංශයන්:**

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්‍ෂක විශ්වවිද්‍යාලය මගින් හෝ ශ්‍රී ලංකා නාවික තාක්‍ෂණ ආයතනය මගින් පිරිනමනු ලබන තුන් අවුරුදු පූර්ණ කාලීන ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමාව සඳහා පහත සඳහන් අංශයන් වෙත බඳවා ගනු ලැබේ.

(1) ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමාව (සාගරික ඉංජිනේරු)
(2) ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමාව (ස්වයං මෝටර් ඉංජිනේරු)
(3) ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමාව (විදුලි ඉංජිනේරු)
(4) ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමාව (විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු)
(5) ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමාව (නැව්බඳ අලුත්වැඩියාවන් සහ නැව් තැනීම සම්බන්ධ ඉංජිනේරු)

3. **අධ්‍යාපන සුදුසුකම්**

(අ) අපොස (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී ගණිතය විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව මව්බස, ඉංග්‍රීසි භාෂාව සහ විද්‍යාව ඇතුළුව විෂයයන් 06 ක් සමත් වී තිබිය යුතු ය.

(ආ) අපොස (උ/පෙළ) විභාගය සඳහා,

(1) භෞතිය විද්‍යා විෂය ධාරාව යටතේ පෙනී සිටීම හෝ

(2) ජීව විද්‍යා විෂය ධාරාව යටතේ පෙනී සිටීම හෝ

(3) තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ, තාක්‍ෂණවේදය සඳහා විද්‍යාව සහ ඉංජිනේරු තාක්‍ෂණවේදය යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම.

4. ඉහත 1 සහ 3 ඡේදයන්හි දක්වා ඇති අවශ්‍යතා සපුරාලනු නොලබන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්‍ෂණයට පැමිණි විට උස, ඇස් පෙනීම හා බර පරීක්‍ෂාව කරනු ලැබේ. *ගැසට්* පත්‍රයේ ඉල්ලා ඇති මිමි වලට අනුව උස, ඇස් පෙනීම හා බර නොමැති අයදුම්කරුවන් සම්මුඛ පරීක්‍ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. යම් අයදුම්කරුවෙකුගේ උස නියමිත පරිදි නොමැති වුවද හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවක් ඇත්නම් නාවික හමුදාධිපතිගේ අනුමැතිය පරිදි එකී අයදුම්කරුවන් පිළිබඳ සලකා බලනු ලැබේ.

5. **සේවා කොන්දේසි:**

(අ) අයදුම්කරුවන් ආධුනිකයන් වශයෙන් බඳවා ගනු ලබන අතර,ඔවුන් මූලික පුහුණුවීමේ පාඨමාලාවන් හැදෑරිය යුතු වේ.

(ආ) පුහුණුව ලබන කාලසීමාව තුළ දී හා ඉන් පසුව,ආධුනිකයන් නාවික හමුදා නීතියට යටත් විය යුතු යි.

(ඇ) සෑම ආධුනිකයෙකුටම සියලුම ආයිත්තම් සහිත නිල ඇඳුම් සපයනු ලැබේ.

(ඈ) පුහුණුව ලබන කාලසීමාව තුළ, ආධුනිකයින් හට නවාතැන් පහසුකම් හා ආහාර නාවික හමුදාව මඟින් සපයනු ලැබේ.

(ඉ) පුහුණුවන කාලසීමාව තුළ දී, යම් ආධුනිකයෙකු හට සිය කැමැත්තෙන් නාවික හමුදාවෙන් ඉවත්වීමට අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ජනරජය මගින් එම ආධුනිකයා වෙනුවෙන් එතෙක් දරා ඇති සියලුම වියදම් එම ආධුනිකයා විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතු වේ.

(ඊ) පුහුණුව ලබන කාලසීමාව තුළ ඕනෑම අවස්ථාවක දී, යම්කිසි ආධුනිකයෙකුගේ නොමනා හැසිරීම මත හෝ ඔහු විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත හෝ ඔහු නාවික හමුදාවේ සේවය සඳහා යෝග්‍ය නොවේ යැයි වගකිව යුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම් එම අවස්ථාවේ දී ම අදාළ ආධුනිකයා විසින් එතෙක් ඔහු වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් ශ්‍රී ලංකා නාවික හමුදාවට ආපසු ගෙවීමට එකඟ වන බවට ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයා වශයෙන් නාවික හමුදාධිපති සමඟ බැඳුම්කරයකට ඇතුළත් විය යුතු යි.

(උ) සියලුම නාවිකයන් රාජකාරි හෝ පුහුණුවීම සඳහා ඕනෑම අවස්ථාවක දී ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයකට හෝ මුහුදු ප්‍රදේශයකට, විදේශ රටකට අනුයුක්ත කරනු ලැබීමට යටත් වෙති.

6. **රාජ්‍ය භාෂා පිළිබඳ අවශ්‍යතා:** තෝරාගනු ලබන අයදුම්කරුවන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝග හා ව්‍යවස්ථාවන් පිළිපැදිය යුතු වේ.

7. **වැටුප් හා දීමනා:**

වැටුප් හා දීමනා ගෙවීම් කරනු ලබන්නේ කළමනාකරණ සේවා චක්‍රලේඛ 05/2025 අනුව වේ.
ඒ අනුව,

| | |
|---|---|
| (අ) මූලික වැටුප | - රු. 47,834.00 |
| (ආ) ජීවන වියදම් දීමනාව | - රු. 17,800.00 |
| (ඇ) දුෂ්කර ලැගුම් දීමනාව | - රු 600.00 |
| (ඈ) නිළ ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනාව | - රු. 350.00 |
| (ඉ) දුෂ්කර දීමනාව (මෙහෙයුම් ප්‍රදේශ සඳහා) | - මූලික පුහුණුවෙන් පසු හිමි වේ. |
| (ඊ) දුෂ්කර දීමනාව (මෙහෙයුම් නොවන ප්‍රදේශ සඳහා) | - මූලික පුහුණුවෙන් පසු හිමි වේ. |
| (උ) අනෙකුත් දීමනා | - විශේෂ දීමනාව රු. 1,000.00 |
| | - විශේෂ අමතර දීමනාව රු. 2,400.00 |
| (ඌ) දළ වැටුප | - **රු 69,984.00** |
| (එ) සලාක දීමනාව (අවස්ථානුකූලව) | - රු 29025.00 |
| (ඒ) දළ වැටුප ආසන්න වශයෙන් (සලාක දීමනාව ඇතුළත්ව) | - **රු 99,009.00** |

(ඔ) නොමිලයේ දුම්රියේ ගමන් කළ හැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (අදාළ පරිදි නාවිකයාට, කලත්‍රයාට, ළමයින්ට සහ යැපෙන්නන්ට) හිමිවනු ලැබේ.

(ඕ) කඳවුර තුළ වාසය කරන නාවිකයින්ට මසකට වරක් නිවස්නයේ සිට තම නිවසට යාමට සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍ර කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.

(ක) නොමිලයේ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ (අදාළ පරිදි නාවිකයාට, කලත්‍රයාට, ළමයින්ට සහ යැපෙන්නන්ට).

(ග) රජයේ නිවාසයක වාසය නොකරන විවාහක නාවිකයින්ට රු.2,400.00 සිට රු.6,600.00 දක්වා ගෙවල් කුලී දීමනාවන් හිමි වේ.

(ච) විවාහක නාවිකයින් සඳහා විවාහක නිවස්නයන්හි පුරප්පාඩු මත නිවාස සැපයේ. මේ සඳහා ගෙවල් කුලිය රාජ්‍ය සේවකයින්ට අදාළ පරිදි අය කරනු ලැබේ.

(ඞ) මූලික පුහුණුවෙන් පසු පිටත වාසය කරන විවාහක නාවික පුද්ගලයින් සඳහා මසකට ආසන්න වශයෙන් රු. 29025.00 ක මුදලක් සලාක දීමනාව වශයෙන් ගෙවනු ලබයි.

8. **වරප්‍රසාද:**

නාවික හමුදාවේ ශිල්පීය අංශයේ නාවිකයින් සඳහා විශේෂිත වූ උසස්වීම් ක්‍රියාපටිපාටියක් අනුගමනය කරන අතර, ඒ අනුව ශිල්පීය නාවිකයින්ට පුරප්පාඩු මත පදනම් නොවූ උසස්වීම් ලබා ගැනීමේ හැකියාව පවතින අතර ශිල්පී I පන්තිය තරාතිරම සහ ඊට ඉහළ තරාතිරමකින් විශ්‍රාම යන නාවික පුද්ගලයින් හට පිරිනමනු ලබන සහතික පත්‍රයෙහි කාර්මික නිලධාරි ලෙස සේවය කර ඇති බවට සඳහන් කර පිරිනමනු ලැබේ.

9. **අයදුම්කරුවන්ට උපදෙස්:**

(අ) අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන ආකෘතියට අනුව අයදුම්පතෙහි සියලුම ඡේදයන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලි අත් අකුරින් සම්පූර්ණ කළ යුතුයි. අයදුම්පත් 2026 සැප්තැම්බර් මස 15 වන දින 1200 පැයට ප්‍රථම ලැබෙන සේ **"ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි (බඳවා ගැනීම්) , නාවික හමුදා මූලස්ථානය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, තැ.පෙ. 593, බත්තරමුල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු ය. ලියාපදිංචි තැපැලෙන් නොලැබෙන අයදුම්පත් බාරගනු නොලැබේ. අයදුම්පත් බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ **"ආධුනික නාවික ශිල්පීන් බඳවා ගැනීම"**යනුවෙන් සටහන් කළ යුතු යි. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හා වේලාවට පසුව ලැබෙන අයදුම්පත් සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවන්ට අනුකූල නොවූ අයදුම්පත් භාර ගනු නොලැබේ. මේ පිළිබඳ වැඩිදුර විස්තර www.navy.lk වෙබ් අඩවියෙන් හෝ දුරකථන අංක 011-7195162, 011-7195155, 076-0275685 මඟින් ලබා ගත හැක.

(ආ) රාජ්‍ය සේවයේ/ සංස්ථා/ මණ්ඩල/ සිවිල් ආයතනයන්හි සේවයේ නියුතු පුද්ගලයින්ගේ අයදුම්පත්,අයදුම්කරුවන් ලෙස තෝරා ගත හොත් නිදහස් කළ හැකි බවට සහතිකයක්ද සහිතව දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ/ ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

(ඇ) සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙනයම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අයදුම්කරුවන් පහත සඳහන් ලියකියවිලිවල මුල්පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

(1) උප්පැන්න සහතිකය
(2) අයදුම් කර ඇති අංශයන්ට අදාළ අධ්‍යාපන සුදුසුකම් ඇති බව සනාථ කිරීමට අධ්‍යාපන සහතික.
(3) පාසල් හැරයාමේ සහතිකය.
(4) මාස 06ක් ඇතුළත ලබා ගත් ග්‍රාම නිලධාරි සහතිකය.
(5) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/ කාර්මික පුහුණුවක් සහ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික.
(6) මෑතකදී ලබා ගත් චරිත සහතික තුනක්, මින් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ විදුහල්පතිතුමාගෙන්/ විදුහල්පතිතුමියගෙන් විය යුතු අතර, අනෙකුත් සහතික අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ වත්මන් සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී සිටී නම්) විය යුතු ය.
(7) ක්‍රීඩා හා වෙනත් ක්‍රියාකාරකම් පිළිබඳ සහතික.

(ඈ) නියම කරන ලද අවස්ථාවන්හි දී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අයදුම්කරුවන්ගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

(ඉ) වෙනත් ලියකියවිලි හෝ මුල් පිටපත් කිසිවක් අයදුම්පත් සමඟ නොඑවිය යුතු ය.

(ඊ) අයදුම්පත සමග සහතිකවල මුල් පිටපත් එවා එම සහතික නැතිවුවහොත් නාවික හමුදාව විසින් ඊට වගකියනු නොලැබේ.

10. අයදුම්පතෙහි අසත්‍ය ප්‍රකාශයන් කර තිබීම, එම අසත්‍යතාවය අයදුම්කරුවන් තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කිරීමටද, තෝරා ගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු ගෙවීමේ පදනම මත සේවයෙන් පහ කිරීමටද යටත් වේ.

11. **තෝරා ගැනීමේ/ සම්මුඛ පරීක්ෂණ ආදිය:**

(අ) ඉහත අවශ්‍යතා සපුරාලන අයදුම්කරුවන් ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් පවත්වනු ලබන මූලික වෛද්‍ය පරීක්ෂණයකින් අනතුරුව තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමට සිදුවේ. එම සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුස්සන් විය හැකි අයදුම්කරුවන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත් විය යුතු ය.

(ආ) ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත් වීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා

| *ඉසව්ව* | *කාලය (මිනිත්තු/ තත්පර)* | *පිරිමි* |
|---|---|---|
| මීටර් 1600 දිවීම<br>Push Up<br>Sit Up | මිනිත්තු 01<br>මිනිත්තු 01 | මිනිත්තු 09<br>12 ක් හෝ ඊට වැඩි<br>10 ක් හෝ ඊට වැඩි |

(ඇ) ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත්වන අයදුම්කරුවන් පමණක් නාවික හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතු අතර, ඉන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් පමණක් ශ්‍රී ලංකා නාවික හමුදාවේ ශිල්පීය අංශයේ ආධුනික නාවිකයන් ලෙස බඳවා ගැනීම සිදු කරනු ලබන අතර යම් අයදුම්කරුවකුගේ උස සහ වයස නියමිත පරිදි නොමැති වුවද නාවික හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් ඔහුට ඇත්නම් සේවා අවශ්‍යතාවය මත නාවික හමුදාධිපතිගේ අනුමැතිය පරිදි ඔහු ගැන සලකා බලනු ලැබේ.

(ඈ) සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන් හට සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනය, වේලාව සහ ස්ථානය ඔවුන් දක්වා ඇති ජංගම දුරකථන අංකයට අදාළව වට්ස්ඇප් (WhatsApp) පණිවුඩ මගින් පමණක් දැනුම් දෙනු ලබන අතර තැපැල් මගින් හෝ වෙනත් කිසිදු ආකාරයකින් සිදු නොකෙරේ. තවද සම්මුඛ පරීක්ෂණවලට සහභාගී වීම සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිදු වියදමක් ගෙවනු නොලැබේ.

(ඉ) මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවෙකු කැඳවනු ලබන සෑම අවස්ථාවක දී ම පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු විසින් ඉදිරිපත් කළ යුතු ය.

(ඊ) අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුව ද එසේ කල යුත්තේ අයදුම්කරුට ලිඛිත චරිත සහතිකයක් දීමෙනි. අයදුම්කරුවකු තෝරා ගැනීම සඳහා කවරාකාරයෙන් හෝ පෙළඹවීම් *නැතහොත්* බලපෑම් කිරීමට උත්සහ කිරීම, අයදුම්කරු නුසුදුසු අයෙකු වීමට හේතු වන්නේය.

(උ) බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන්ට ඒ බව දන්වා සිටිනු නොලැබේ.

(ඌ) අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික විභාග දෙපාර්තමේන්තුව සහ අදාළ ආයතන සමග සම්බන්ධීකරණය වී ඒවායේ සත්‍යතාවය සහතික කරගනු ලබයි.

(එ) සියළුම අයදුම්කරුවන් ආරක්ෂක නිශ්කාශණ වාර්ථා ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය මගින් නැවත පරීක්ෂාවට යොමු කරනු ලැබේ.

(ඒ) ශ්‍රී ලංකා නාවික හමුදාවට අයදුම්කරුවන් බඳවා ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ අවසන් තීරණ ගැනීමේ බලතල ශ්‍රී ලංකා නාවික හමුදාධිපති සතුවන අතර, ජාතික ආරක්ෂාව, ශ්‍රී ලංකා නාවික හමුදාවේ සංග්‍රාමික සහ පරිපාලනමය අවශ්‍යතාවයන් අනුව ඉහත අවශ්‍යතාවයන් සහ කොන්දේසිවල වෙනස් කම් සිදු කිරීමේ අවසාන තීරණය නාවික හමුදාධිපති සතු වේ.

*සටහන* - මෙම *ගැසට්* නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම පළවන අතර සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

**කේඩීඩීසී ප්‍රනාන්දු , ආර්එස්පී, යූඑස්පී, ආර්සීඩීඑස්,**
වයිස් අද්මිරාල්,
ශ්‍රී ලංකා නාවික හමුදාධිපති.

ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
තැ.පෙ. 593,
බත්තරමුල්ල.

**ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ ශිල්පීය අංශයන් වෙත ආධුනික නාවිකයින් බඳවා ගැනීම සඳහා වූ ඉල්ලුම්පත**

1. පුරවැසිභාවය :
(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින්ද, ලියාපදිංචි වීමෙන්ද, යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න)
2. අයදුම් කරන අංශය (ප්‍රමුඛතාවය අනුව) :
3. සම්පූර්ණ නම : (ජාතික හැඳුනුම්පතට අනුව)
4. ජාතික හැඳුනුම්පත් අංකය :
5. ස්ථිර ලිපිනය :
6. තැපැල් ලිපිනය :
7. උපන් දිනය :
8. වයස අවුරුදු ....... මාස ....... දින ....... (2026 සැප්තැම්බර් මස 15 වන දිනට)
9. උස ...........(සෙ.මී) පපුව ........(සෙමී) බර ........(කි.ග්‍රෑ)
10. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :
11. දිස්ත්‍රික්කය :
12. ඡන්ද කොට්ඨාසය :
13. ග්‍රාම නිලධාරී කොට්ඨාසය :
14. දුරකථන අංකය :
15. වට්ස්ඇප් (WhatsApp) අංකය :
16. විවාහක හෝ අවිවාහක බව :
17. ස්ත්‍රී පුරුෂ භාවය :
18. අධ්‍යාපනය ලැබූ පාසල් : (අනුපිළිවෙලින් සඳහන් කරන්න)
19. පාසල/ පාසල් පිළිබඳ විස්තර :

| *පාසලේ / විශ්ව විද්‍යාලයේ නම* | *සමත් විභාගය* | *විභාගයට පෙනී සිටි වර්ෂය* | *සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුළුව)* |
|---|---|---|---|
| | අ.පො.ස . (සා.පෙළ)<br>අ.පො.ස . (උ.පෙළ)<br>වෙනත් | | |

| *පාසලේ නම* | *අ.පො.ස උ/පෙළ පෙනී සිටි විෂයය ධාරාව* | *විභාගයට පෙනී සිටි වර්ෂය* |
|---|---|---|
| | භෞතිය විද්‍යා විෂයය ධාරාව<br>ජීව විද්‍යා විෂයය ධාරාව<br>තාක්‍ෂණවේදය විෂයය ධාරාව | |

20. පාසලෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර :

| *සේවා යෝජකයාගේ නම සහ ලිපිනය* | *රැකියාවේ ස්වභාවය* | *සේවා කාලය* | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

21. මව්පියන් පිළිබඳ විස්තර :

| *සම්පූර්ණ නම* | *උපන් ස්ථානය* | *රැකියාව* | *වර්තමාන ලිපිනය* |
|---|---|---|---|
| පියා<br>මව | | | |

22. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :

23. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ටතා පිළිබඳ විස්තර : (ඔබ සහභාගී වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම් , දිනයන් හා ලැබූ විශිෂ්ටතා දක්වන්න)

24. පාසලේ දී හෝ බාහිර සංවිධානවලදී දක්වා ඇති වෙනත් විශිෂ්ටතා : (දිනයන් සමග විස්තර දක්වන්න)

25. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ ඇති සේවය :

26. ශ්‍රී ලංකා නාවික හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මීට පෙර ඉල්ලීම් කර තිබේද?එසේ නම් , ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදු වූයේ කුමක්දැයි සඳහන් කරන්න.

27. මීට ප්‍රථම යුධ,නාවික සහ ගුවන් හමුදාවල නිත්‍ය හෝ ස්වේච්ඡා බලකායන් හි සේවය කර ඇත්නම් එසේ සේවය කරනු ලැබූ කාල පරිච්ඡේදය හා දැරූ තනතුරු පිළිබඳ සඳහන් කරන්න.

28. ඔබ කිසියම් හේතුවක් මත සිවිල් හෝ යුධ අධිකරණයක දී වැරදිකරු වී හෝ අත්හිට වූ සිර දඬුවම් ලබා තිබේද? එසේ නම් අදාළ විස්තර සඳහන් කරන්න.

29. රජයේ දෙපාර්තමේන්තුවක දී හෝ රාජ්‍ය අංශයෙහි/ මණ්ඩලයක/ සංස්ථාවක (මහ බැංකුව ,ජාතික බැංකු, විශ්ව විද්‍යාල, රජය විසින් පාලනය කරන බද්ධ ව්‍යාපාර , සමාගම් ආදිය ඇතුලුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු සඳහන් කරන්න.

30. චරිත සහතික පිළිබඳ විස්තර :

| *නම* | *පදවිය* | *තැපැල් ලිපිනය* |
|---|---|---|
| | | |

31. අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

පූර්වෝක්ත ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළවූ ශ්‍රී ලංකා නාවික හමුදාවේ ශිල්පීය අංශය සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙළ හා ඊට අදාළ වන කරුණු ද මම කියවා අවබෝධ කර ගතිමි.

දිනය : ......................................                ..............................................,
අයදුම්කරුගේ අත්සන.

ඔබ විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත ලියාපදිංචි තැපෑලෙන් (සුදුසුකම්වල අදාළ ලිපි ලේඛනවල පිටපත් ද සමග) ලිපිනයට යොමු කරන්න.

**ජ්‍යෝෂ්ඨ මාණ්ඩලික නිලධාරි (බඳවා ගැනීම්),**
**නාවික හමුදා මූලස්ථානය,**
**ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,**
**තැපෙ 593,**
**බත්තරමුල්ල.**

සම්බන්ධතා විස්තර - දුරකථන : **011-7195155, 011-7195162** ජංගම දුරකථන : **076-0275685**

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**

## ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරී ඛණ්ඩ - 01 සේවා ගණයේ (MN 06 – 2006 A) මනෝ විද්‍යාඥ II ශ්‍රේණියේ තනතුරු සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2026

**1.0.** සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන රෝහල් හා ආයතන සඳහා ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරී ඛණ්ඩ - 01 සේවා ගණයේ (MN 06 – 2006 A) ට අයත් මනෝ විද්‍යාඥ II ශ්‍රේණියේ තනතුරු 07 ක් සඳහා විවෘත පදනමින් බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**2.0.** **බඳවා ගැනීමේ ක්‍රමය :**

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන අයදුම්කරුවන් අතුරින් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් පවත්වනු ලබන ලිඛිත විභාගයේ ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් කායික යෝග්‍යතාව සහ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකට යොමුකිරීමෙන් පසුව පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ.

**3.0.** පවත්නා පුරප්පාඩු මත පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක දිනය සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම සම්පූර්ණ කිරීමට/නොකිරීමට ද අමාත්‍යාංශ ලේකම් වෙත බලය ඇත.

**4.0.** **භාෂා මාධ්‍ය :**

මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අපේක්ෂකයින්ට සිය මනාපය පරිදි මින් එක් භාෂා මාධ්‍යකින් පමණක් මෙම විභාගයට පෙනී සිටිය හැකි අතර ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

**5.0.** මෙම තනතුර සඳහා අයදුම් කරනු ලබන අයදුම්කරුවන් පහත සුදුසුකම් සපුරා තිබිය යුතු ය :

**5.1 මූලික සුදුසුකම් :**

I. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

II. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

III. අයදුම්පත් කැඳවනු ලබන අවසාන දිනය වන විට අයදුම්කරුවන් විසින් අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

**5.2 අධ්‍යාපන සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් මනෝ විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් සමග මනෝ විද්‍යාව සම්බන්ධ පශ්චාත් උපාධියක් ලබා තිබීම;

*සහ*

අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයයට සම්මාන සමාර්ථයක් ලබා තිබීම.

**5.3 වෘත්තීය සුදුසුකම් :**

රජය පිළිගත් වෛද්‍ය ආයතනයක සායනික මනෝ විද්‍යාව පිළිබඳ ( Clinical Psychology) වසර 02ක පුහුණුවක් ලබා තිබීම;

*සහ*

මනෝ වෛද්‍ය විශේෂඥවරයෙකුගේ අධීක්ෂණය යටතේ මාස (06) ක පුහුණුවක් ලබා තිබීම.

**5.4 කායික සුදුසුකම් :**

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

**6.0.** **වයස් සීමාව :**

ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය.

**7.0.** **වැටුප් පරිමාණය :**

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු.62, 230 – 10 x 1,190 – 11 x 1,360 x 15 x 1,670 – රු. 114,140

**8.0. ලිඛිත පරීක්ෂණය :**

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂයය නිර්දේශ* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 01.බුද්ධි පරීක්ෂණය | පද සංඛ්‍යාව හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටලු සම්බන්ධයෙන් අපේක්ෂකයා දක්වන නිගමන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටලු පිළිබඳ අර්ථාවබෝධය, ප්‍රමාණීකරණය හා කාලය හා අවකාශය අතර සහසම්බන්ධතා වටහා ගැනීමෙහිලා අපේක්ෂකයෙකු සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. | පැය 1 1/2 | 100 | 40% |
| 02.විෂයානුබද්ධ දැනුම | මානසික සෞඛ්‍ය හා මනෝ විද්‍යාත්මක ප්‍රතිකාර ආශ්‍රයෙන් මෙම ප්‍රශ්න පත්‍රය සකස් වේ. | පැය 03 | 100 | 40% |

**9.0. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :**

I. බඳවා ගනු ලබන නිලධාරීන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට එකඟ විය යුතු ය.

II. මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිත ය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක විය යුතු ය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 ට අනුව රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාව සම්පූර්ණ කළ යුතු ය.

IV. මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.

V. මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, MN-06 -2006 ඒ බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් විධිවිධානවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද යටත් වේ.

**10.0. අයදුම්පත් ඉදිරිපත් කිරීම :**

I. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් **A4** ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 06 දක්වාත් 02 වන පිටුව අංක 07 සිට 09 දක්වාත් අනෙකුත් කරුණු ඊළග පිටුවලටද වන ආකාරයෙන් පිළියෙළ කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

II. තනතුරට බඳවා ගැනීමේදී සලකා බලන අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් සනාථ කරන සහතික පත්‍ර අයදුම්කරු විසින් සත්‍ය පිටපත් බවට සහතික කර අයදුම්පත්‍රය සමඟ යොමු කිරීම අනිවාර්ය වේ.

III. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය **2026.09.11** වේ. අයදුම්පත් **2026.09.11** වැනි දිනට හෝ එදිනට ප්‍රථම අධ්‍යක්ෂ (පාලන) 07, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, අංක 106, ඩඩ්ලි සේනානායක මාවත, කොළඹ 08 යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

IV. අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙලවරේ **"මනෝ විද්‍යාඥ තනතුරට බඳවා ගැනීම (විවෘත) සඳහා අයදුම්පත්‍රය"** යනුවෙන් සඳහන් කළ යුතු යි.

V. මේ පිළිබඳ ඉදිරි ලිපි ගනුදෙනු විද්‍යුත් තැපැල මගින් සිදු කිරීමට ද ඉඩ ඇත. එම නිසා ඔබගේ භාවිතයේ පවතින විද්‍යුත් තැපැල් ලිපිනයක් ලබාදීම අනිවාර්ය වන අතර ඒ පිළිබඳ අවධානයෙන් සිටිය යුතු වේ.

VI. විභාග ගාස්තුව රු.1000.00/= කි. විභාග ගාස්තුව කුමන හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ. **ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ " සෞඛ්‍ය ලේකම් " නමින් ඇති ගිණුම් අංක 7041318 ගිණුමට** බැරවන පරිදි මෙම මුදල ඕනෑම ලංකා බැංකු ශාඛාවකට ගෙවා ලබා ගත් රිසිට්පත ආදර්ශ අයදුම්පතෙහි ඇති කොටුව තුළ නොගැලවෙන සේ ඇලවිය යුතු ය. ( මුදල් ඇණවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.)

VII. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු / සාමදාන විනිශ්චයකාරවරයකු / දිවුරුම් කොමසාරිස්වරයකු / නීතිඥවරයකු / ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ ත්‍රිවිධ හමුදා අධිකාරීලත් නිලධාරියකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 854,880/= කට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතු ය.

VIII. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

IX. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් තරග විභාගයට කැඳවනු ලබන අතර ඒ බව අයදුම්පතෙහි සඳහන් ලිපිනයට දැනුම් දෙනු ලැබේ.

**11.0.අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :**

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

**12.0.සාවද්‍ය තොරතුරු සැපයීම :**

ඔබ විසින් එවන ලද අයදුම් පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත් සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

**විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ,**
ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

**2026 අගෝස්තු මස 02 දින,**
**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,**
**අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,**
**කොළඹ 10.**

## ආදර්ශ ඉල්ලුම් පත්‍රය

### සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මනෝවිද්‍යාඥ II ශ්‍රේණියේ තනතුරට විවෘත පදනම මත බඳවා ගැනීම - 2026

විභාගය සඳහා ඉදිරිපත් වන මාධ්‍යය : (සිංහල - S/ ඉංග්‍රීසි - E/ දෙමළ -T) ☐

පදිංචි දිස්ත්‍රික්කය : ☐

01. 1.1 අයදුම්කරුගේ මුලකුරු සමඟ නම -:Mr./Mrs./Miss. ......................................................................................
.......................................................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා: -:Mr../~~Mrs./Miss.~~ SILVA A.B.

1.2 සම්පූර්ණ නම -: ..........................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..........................................................................................................................

1.3 සම්පූර්ණ නම -: ..........................................................................................................................
(සිංහලෙන්/දෙමළෙන්) ..........................................................................................................................

02. 2.1 ලිපිනය (පෞද්ගලික) -: ..........................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..........................................................................................................................

2.2 ලිපිනය (පෞද්ගලික) -: ..........................................................................................................................
(සිංහලෙන්/දෙමළෙන්) ..........................................................................................................................

2.3 ලිපිනය(රාජකාරී) -: ..........................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..........................................................................................................................

2.4 ලිපිනය(රාජකාරී) -: ..........................................................................................................................
(සිංහලෙන්/දෙමළෙන්) ..........................................................................................................................
(ලිපිනයෙහි වෙනසක් වේ නම් එය වහාම දැන්විය යුතු ය.)

2.5 දුරකථන අංකය (පෞද්ගලික :-............................................................

2.6 දුරකතන අංකය (කාර්යාලීය) :-............................................................

2.7 විද්‍යුත් ලිපිනය (e-mail Address) :-............................................................

03. 3.1 උපන් දිනය-:

| වර්ෂය | මාසය | දිනය |
|---|---|---|
| ☐☐☐☐ | ☐☐ | ☐☐ |

3.2 අයදුම්පත භාර ගන්නා අවසාන දිනට වයස -: අවු:..........මාස:.......... දින:.....

04. ජාතික හැඳුනුම්පත් අංකය -: ............................................................

05. ස්ත්‍රී/පුරුෂ භාවය -: ............................................................

06. *සුදුසුකම් -:*
6.1 අදාළ අධ්‍යාපන සුදුසුකම් :
.................................................................................................................................................................
6.2. වෘත්තීය සුදුසුකම් :
.................................................................................................................................................................
.................................................................................................................................................................
.................................................................................................................................................................

07. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :- ..................................................................

7.1. විභාග ගාස්තු ගෙවූ කාර්යාලය : - .........................................................
7.2. ලදුපත් අංකය හා දිනය :- ...........................................................
7.3. ගෙවූ මුදල :- ............................................................

**ලංකා බැංකු ශාඛාවකට රු.1000.00 ක මුදල ගෙවා ලබා ගත් රිසිට්පත නොගැලවෙන සේ මෙහි අලවන්න.**

08. *අයදුම්කරුගේ සහතිකය :*

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව සොයාගනු ලැබුව හොත් එසේ සොයා ගන්නා ලද්දේ තෝරා ගැනීමට පෙර නම් එම අයදුම්පත අවලංගු වන බවද, තෝරා ගැනීමෙන් පසුව නම් යම්කිසි වන්දියක් නොමැතිව මම සේවයෙන් පහකරනු ලබන බවද පිළිගනිමි.

දිනය -:............................... ..........................................,
අයදුම්කරුගේ අත්සන.

09. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............................................................ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, ඔහු/ඇය මා ඉදිරිපිට දී .....................................දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

..........................................,
සහතික කරන්නාගේ අත්සන
(රබර් මුද්‍රාවකින් සනාථ කළ යුතු ය)

සම්පූර්ණ නම - ...................................................................................................
තනතුර - ...................................................................................................
ලිපිනය - ....................................................................................................

10. *දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානියාගේ සහතිකය -: (රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අය සඳහා පමණි.)*

මෙම ඉල්ලුම්කරු වන......................................................................... මයා/මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/පළාත් සභාවේ/ආයතනයේ ..........................................වැනි දින සිට සේවය කරයි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් මුදවා හරින/නොහරින බවද.........................දින ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මින් සහතික කරමි.

............................................................,
දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම - .......................................................................................................
පදවි නාමය -.......................................................................................................
දිනය -.......................................................................................................
දෙපාර්තමේන්තුව /ආයතන -.......................................................................
(රබර් මුද්‍රාවකින් සනාථ කළ යුතු ය)

**අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය**

ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවෙහි කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බහුකාර්ය බණ්ඩ 01 සේවා ගණයේ ලසු ලේඛක (සිංහල) තනතුර සඳහා වන බඳවා ගැනීම (විවෘත) - 2026

අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය යටතේ ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින සිංහල මාධ්‍යය ලසු ලේඛක තනතුරු 03 ක් සඳහා විවෘත පදනමින් බඳවා ගැනීමට පහත සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර **ලේකම්, ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව, අංක.46,48 ආචාර්ය එන්.එම්.පෙරේරා මාවත, කොළඹ 08,** යන ලිපිනයට **ලියාපදිංචි තැපෑලෙන්** එවිය යුතුය. කවරයේ වම් පස ඉහළ කෙලවරේ **"ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවෙහි කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බහුකාර්ය බණ්ඩ 01 සේවා ගණයේ ලසු ලේඛක (සිංහල) තනතුර සඳහා වන බඳවා ගැනීම (විවෘත) - 2026"** යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය.

**අයදුම්පත් කැඳවන අවසාන දිනය 2026.09.21** දින වේ.

*සටහන* **-** ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ.

**01. සේවා නියුක්ත කරවීමේ කොන්දේසි -**

I. මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිත වේ. (විශ්‍රාම වැටුප් සහිත බව ඉදිරියේ දී රජය ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ අනුව වෙනස් වේ.)

II. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරියෙකු වසර 03 ක පරිවාස කාලයකට යටත් වන අතර, එම කාලය ඇතුලත පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට ආනුශංගික චක්‍රලේඛ අනුව භාෂාව පිළිබඳ ප්‍රවීණතා මට්ටම වසර 05ක් තුල දී ලබා ගත යුතු ය. රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරින් විසින් වසර 03ක් තුළ දී එක් රාජ්‍ය භාෂාවක් පිළිබඳ ප්‍රවීණතාව ලබා ගත යුතු අතර, අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාව වසර 05ක් ඇතුළත ලබා ගත යුතු ය.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසි වලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝග වලට ද මෙම පත්වීම යටත් වේ.

**02. බඳවා ගැනීමේ ශ්‍රේණිය -** III වන ශ්‍රේණිය

**03. වැටුප් පරිමාණය -**

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ උපලේඛ II අනුව මෙම පත්වීමට හිමි මාසික වැටුප් ක්‍රමය (MN 02-2025) රු.48,470 – 10x540 – 11x630 – 10x010 – 10x1,190 – රු. 82,800/- ක් වන අතර එම වැටුප ඔබට හිමි වන්නේ 2027.01.01 දින සිට වේ. පත්වීම ක්‍රියාත්මක වන දින සිට මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි ඔබට වැටුප් ගෙවනු ලැබේ.

**04. සුදුසුකම් -**

I. අධ්‍යාපන සුදුසුකම්:

(අ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව ගණිතයද ඇතුළුව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

*සහ*

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සියළුම විෂයයන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) එකවර සමත්ව තිබීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03 කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.)

II. වෘත්තීය සුදුසුකම්:

ජාතික තරුණ සේවා සභාව, ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය, කාර්මික විද්‍යාල, රජයේ ලියාපදිංචි පුහුණු ආයතනයක හෝ තෘතීයික හා වෘත්තීය පුහුණු අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක ලසු ලේඛනය පිළිබඳ මාස 06 කට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම;

*හෝ*

අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී යතුරු ලියනය සහ ලසු ලේඛනය විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම;

*හෝ*

කාර්මික විද්‍යාල වලින් ලේකම් පරිචය පාඨමාලාව හදාරා අධිකරණමය නොවන නිලධාරින් පුහුණු කිරීමේ ආයතනයෙන් ලඝු ලේඛනය හා යතුරු ලියනය පිළිබඳව තවදුරටත් මාස 06ක පාඨමාලාවක් හදාරා එම පාඨමාලාව අනුව අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ හෝ අධිකරණයක මාස හයක (06) ප්‍රායෝගික පුහුණුවක් ලබා තිබීම.

III. පළපුරුද්ද :

විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

**05. වයස් සීමාව -**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.

**06. කායික සුදුසුකම් -**

ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

**07. වෙනත් සුදුසුකම් -**

I. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

II. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය. සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු ය.

**08. බඳවාගැනීමේ ක්‍රමය -**

අයදුම්කරුවන් තම අයදුම්පත ඉල්ලුම් කරන මාධ්‍යයෙන්ම වෘත්තීය හා යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටිය යුතු ය.

08.1 **වෘත්තීය පරීක්ෂණය -**

ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ ලේකම් විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින් පවත්වනු ලබන වෘත්තීය පරීක්ෂණය මගින් ලකුණු ලබා දේ.

වෘත්තීය පරීක්ෂණය සම්බන්ධ විස්තර :

| | *විෂය ක්ෂේත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|
| 01 | ලඝු ලේඛනය (සිංහල) | විනාඩි 45 | 100 | 40% |
| 02 | යතුරුලියනය (සිංහල) | විනාඩි 20 | 100 | 40% |

විභාගය සඳහා වන ප්‍රධාන විෂය නිර්දේශය :

| | විෂයය ක්ෂේත්‍රය | විෂයය නිර්දේශය |
|---|---|---|
| 03 | ලඝු ලේඛනය ( සිංහල ) | මිනිත්තු 05ක් තුළ නොකඩවා කියවනු ලබන ඡේදයක් මිනිත්තුවකට වචන 60ක වේගයෙන් ලඝු සටහනින් ලියා එම සටහන් මිනිත්තුවකට වචන 08ක වේගයෙන් සාමාන්‍ය ආකාරයට ලිවීමේ හැකියාව මැන බැලීමේ පරීක්ෂණයකි. |
| 04 | යතුරුලියනය ( සිංහල ) | වචන 400ක් පමණ වූ පාඨයක් නිවැරදිව මිනිත්තු 20ක් ඇතුළත මිනිත්තුවකට වචන 20ක වේගයෙන් යතුරු ලියනය කිරීමේ හැකියාව මැන බැලීමේ පරීක්ෂණයකි. |

08.2 **යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය -**

ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ ලේකම් විසින් පත් කරනු ලබන යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ලකුණු ලබා දෙනු ලැබේ.

**යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙන ක්‍රමය -**

| *ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01.අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 10 | අදාළ නොවේ. |
| 02.අතිරේක වෘත්තීය සුදුසුකම් | 20 | |
| 03.භාෂා දැනුම (සිංහල/දෙමළ/ඉංග්‍රිසි භාෂාවට ඇති ප්‍රවීණතාව) | 10 | |
| 04.පරිගණක දැනුම | 15 | |

| *ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 05.පළපුරුද්ද<br>06.සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාවය | 40<br>05 | |
| එකතුව | 100 | |

08.3 **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය -**

ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කරන අතර ලකුණු ලබා දෙනු නොලැබේ.

*සටහන :*

වෘත්තීය පරීක්ෂණය සමත් අයදුම්කරුවන් අතුරින් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබයි. යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය හා වෘත්තීය පරීක්ෂණය යන දෙකෙන්ම ලබා ගන්නා මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

**09.** ඉල්ලුම් පත්‍රය සෙ.මී.22 - 29 ප්‍රමාණයේ A4 කඩදාසි වල සකස් කළ යුතු අතර, 1 -5 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද, 6- 15තෙක් ශීර්ෂ දෙවන පිටුවට ද, 16 සිට අනෙකුත් ශීර්ෂ තෙවන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතු ය. ඊට අදාල තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුලත් කළ යුතු ය. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන, මූලික සුදුසුකම් නොමැති, නියමිත දිනට පසුව ලැබෙන හා ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ළඟ ලබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය, නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිලිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුන හොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත්, වැඩිදුරටත් දන්වමි. ඉල්ලුම් පත මේ සමග ඇති ආදර්ශ ඉල්ලුම් පතට අනුව සැකසිය යුතු ය. ඉල්ලුම් පත්‍ර ලැබුනු බව දන්වනු නොලැබේ. අවසාන දිනය දක්වා අයදුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතු ය.

*සැලකිය යුතු ය -*

ඉල්ලූ අවස්ථාවක දී ලියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින්ගේ අයදුම්පත්‍රය ගැන සලකා බලනු නොලැබේ.

**10.** **විභාග ගාස්තු -**

සෑම අයදුම්කරුවෙකුම විභාග ගාස්තු ලෙස රු.1500/-ක මුදලක් **මහජන බැංකුවේ නගර මධ්‍ය ශාඛාවේ** ණය සහණදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ ලේකම්ගේ නමට වන සේ ගිණුම් අංක **176100159026581** දරණ ජංගම ගිණුමට බැර කළ යුතු වේ. අදාල කුවිතාන්සියේ මුල් පිටපත අයදුම්පතෙහි නියමිත ස්ථානයේ අමුණා එවිය යුතු ය.

**11.** රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බහුකාර්ය ඛණ්ඩ 01 සේවා ගණයේ ලඝු ලේඛක (සිංහල) තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

සුභාෂිණී දයානන්ද මිය,
ලේකම්,
ණය සහනදායක මණ්ඩලයීය
දෙපාර්තමේන්තුව.

2026 අගෝස්තු මස 13 වැනි දින,
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව.

අංකය........................
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

**ආදර්ශ අයදුම්පත්‍රය**

අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බහුකාර්ය ඛණ්ඩ 01 සේවා ගණයේ ලඝු ලේඛක (සිංහල) තනතුර සඳහා බඳවා ගැනීමේ අයදුම්පත්‍රය

01. (අ) මුලකුරු සමඟ නම (සිංහලෙන්) - ..............................................................................................
මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) - ........................................................................
.....................................................................................................................................................
.....................................................................................................................................................

(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්) - ..........................................................................................
..............................................................................................................................
..............................................................................................................................
සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) - ..........................................................................
..............................................................................................................................
..............................................................................................................................

02. ස්ථිර ලිපිනය (සිංහලෙන්) - ..........................................................................................
..............................................................................................................................
..............................................................................................................................

03. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) - ..........................................................................
..............................................................................................................................
..............................................................................................................................

04. ලිපි ලැබිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) - ..........................................................
..............................................................................................................................
..............................................................................................................................
(ස්ථිර ලිපිනයෙන් වෙනස් වේ නම් පමණක් සම්පූර්ණ කරන්න)........................................................
..............................................................................................................................
..............................................................................................................................

05. විද්‍යුත් තැපැල් ලිපිනය - ..........................................................................................

06. දුරකථන අංකය - (ජංගම) : ........................................... (ස්ථාවර) : ......................................
(සම්බන්ධ කර ගත හැකි ජංගම දුරකතන අංකයක් අනිවාර්යයෙන් සඳහන් කරන්න.)

07. ජාතික හැඳුනුම්පත් අංකය - ..........................................................................................

08. ස්ත්‍රී/පුරුෂ භාවය - ..........................................................................................

09. උපන් දිනය - වර්ෂය : .............................. මාස : ................................ දින : ..............................

10. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස - වර්ෂ : ............... මාස : .................. දින : ..................

11. ජාතිය - ..........................................................................................

12. විවාහක/අවිවාහක බව - ..........................................................................................

13. අ.පො.ස.(උසස් පෙළ) විභාගය :

| අනු. අංකය | විෂයය | පළමුවර | දෙවනවර | තෙවනවර |
|---|---|---|---|---|
| | | වර්ෂය: .......... විභාග අංකය : ........... | වර්ෂය : ........... විභාග අංකය : ............ | වර්ෂය: ........... විභාග අංකය : ........... |
| | | ශ්‍රේණිය | ශ්‍රේණිය | ශ්‍රේණිය |
| 1 | | | | |
| 2 | | | | |

| අනු. අංකය | විෂයය | පළමුවර | දෙවනවර | තෙවනවර |
|---|---|---|---|---|
| | | වර්ෂය: .......... විභාග අංකය : .......... | වර්ෂය : .......... විභාග අංකය : ........... | වර්ෂය: .......... විභාග අංකය : .......... |
| | | ශ්‍රේණිය | ශ්‍රේණිය | ශ්‍රේණිය |
| 3 | | | | |
| 4 | | | | |

14. අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගය :
වර්ෂය ............................ විභාග අංකය .................................

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

15. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 04 වන ඡේදයට අනුව සුදුසුකම් -

I. අධ්‍යාපන සුදුසුකම් - ...........................................................................................................
...........................................................................................................
...........................................................................................................

II. වෘත්තීය සුදුසුකම් - ...........................................................................................................
...........................................................................................................
...........................................................................................................

III. පළපුරුද්ද - ...........................................................................................................
...........................................................................................................
...........................................................................................................

16. භාෂා ප්‍රවීණතාව - (අදාළ තීරුවේ √ ලකුණ යොදන්න)

| | ඉතා හොඳයි | හොඳයි | සාමාන්‍යයයි | දුර්වලයි |
|---|---|---|---|---|
| සිංහල | | | | |
| දෙමළ | | | | |
| ඉංග්‍රීසි | | | | |

17. විභාග ගාස්තු ගෙවූ කුවිතාන්සිය -

| |
|---|
| |

**අයදුම්කරුගේ සහතිකය**

.......................................................................... වන මම මෙහි සඳහන් කරන ලද සියළුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මම රජයේ සේවයෙන් පහකර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාව මත සේවයෙන් විශ්‍රාම ගන්වා හෝ නොමැති බවත්, තනතුරු අතහැර ගිය අයකු සේ සලකා නැති බවත් සහතික කරමි. මෙහි අන්තර්ගත කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරා ගැනීමට කළින් හෙළිවුවහොත් නුසුදුසු කිරීමට යටත් වන බවත්, තෝරා ගැනීමෙන් අනතුරුව එවැනි තත්ත්වයක් අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා රැකියාවෙන් ඉවත් කළ හැකි බවත් මම දනිමි.

දිනය - .........................................

.........................................,
අයදුම්කරුගේ අත්සන.

08 - 245

---

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

ඉස්ලාම් දීනියාත් (ධර්මාචාර්ය) සහතික පත්‍ර විභාගය - 2025 (2026)

**2024 සහ 2025 වසරවලට නියමිත** ඉස්ලාම් දීනියාත් (ධර්මාචාර්ය) සහතික පත්‍ර විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලබන අතර, විභාගය 2026 නොවැම්බර් මස පැවැත්වීමට කටයුතු යොදා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

**02.** විභාග මධ්‍යස්ථාන :- **උපලේඛනය - 01හි දක්වා ඇති සෑම දිස්ත්‍රික්කයකම පිහිටි නගරවල අයදුම්කරුවන් සංඛ්‍යාව අනුව විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ඇත. එහෙත් යම් නගරයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන අවස්ථාවලදී එකී නගරයේ විභාග මධ්‍යස්ථාන අවලංගු කොට අදාළ අයදුම්කරුවන් ඊට ආසන්නව පිහිටි වෙනත් විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කිරීමට සිදුවනු ඇත.**

**03.** භාෂා මාධ්‍යය :- මෙම විභාගය දෙමළ, සිංහල හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. එහෙත් යම් අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු ලබන්නේ තමන් කැමති එක් භාෂා මාධ්‍යයකින් පමණි. අයදුම්පතේ සඳහන් කරන ලද භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

**04.** සුදුසුකම්:- මෙම විභාගය සඳහා අයදුම් කරන සෑම අයදුම්කරුවකුම පහත දක්වා ඇති සුදුසුකම් අතුරින් යටත් පිරිසෙයින් කවර හෝ එක් සුදුසුකමක් සපුරා තිබිය යුතු ය.

**4.1** ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන අහදියියා දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය සමත් වී තිබීම.

**4.2** මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අරාබි විද්‍යාලවලින් නිකුත් කරනු ලබන මව්ලවි සහතිකයක් ලබා තිබීම.

**4.3** ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන අ.පො.ස. (උ/පෙළ) විභාගයේ ඉස්ලාම් හෝ ඉස්ලාමීය ශිෂ්ටාචාරය යන විෂයයන් දෙකෙන් එකක් ද ඇතුළුව විෂයයන් තුනකින් සමත් වී තිබීම.

**4.4** ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන අ.පො.ස. (සා/පෙළ) විභාගයේ ඉස්ලාම් විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව සමත්

අහදියියා පාසලක හෝ අරාබි විදුහලක හෝ වසරකට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති ආචාර්යවරයකු වීම.

**05.** අයදුම් කිරීම :-

**5.1** ලියාපදිංචි අහදියියා දහම් පාසල් / අරාබි විදුහල් ප්‍රධානීන් විසින්ම ඉදිරිපත් කළ යුතු මෙම අයදුම්පත් තැපැල් මගින් මේ වන විට අහදියියා දහම් පාසල් / අරාබි විදුහල් වෙත යොමුකර ඇති අතර www.doenets.lk වෙබ් අඩවිය මගින් ද බාගත කර ගැනීමේ පහසුකම් සලසා ඇත.

**5.2** නව අහදියියා දහම් පාසලක් / අරාබි විදුහලක් විසින් අයදුම්පත් ඉදිරිපත් කරන්නේ නම් මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදංචි සහතිකයේ පිටපතක් අයදුම්පතට අමුණා එවිය යුතුය.

**5.3** කවර හෝ අයදුම්කරුවකුට බාහිර අයදුම්කරුවකු වශයෙන් විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. එසේ වුවත් 4 වැනි ඡේදයේ සුදුසුකම් සපුරා ඇති යම් විභාග අපේක්ෂකයකු වේ නම් තමන් පදිංචි ස්ථානයට ආසන්න අහදියියා දහම් පාසල හෝ අරාබි විදුහල මගින් රුපියල් 200/-ක විභාග ගාස්තුවක් ගෙවා විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ හැකිය. මේ සඳහා අවශ්‍ය උපදෙස් සියලුම අයදියියා දහම් පාසල් / අරාබි විදුහල් වෙත ලබා දී ඇත.

**5.4** අදාළ අහදියියා දහම් පාසල් / අරාබි විදුහල් ප්‍රධානීන් විසින්ම ඉදිරිපත් කළ යුතු මෙම අයදුම්පත් පිටපත් දෙකකින් යුක්තව සකස් කර මුල් පිටපත විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු අතර දෙවන පිටපත අහදියියා දහම් පාසල් / අරාබි විදුහල් ප්‍රධානීන් වෙත තබා ගත යුතු ය. අයදුම්පත් දෙකෙහිම අහදියියා දහම් පාසල් / අරාබි විදුහල් ප්‍රධානීන් අත්සන් කර තිබිය යුතු ය.

**5.5** මෙම විභාගය සඳහා විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන් ඉදිරිපත් වන්නේ නම් ඒ බව අයදුම්පතේ අනිවාර්යයෙන් සඳහන් කළ යුතු අතර අදාළ වෛද්‍ය සහතිකවල පිටපත් අයදුම්පතේ මුද්‍රිත පිටපතක් සමඟ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

**5.6** අයදුම්පත් භාරගැනීම **2026.08.21** දිනෙන් ආරම්භ වී **2026.09.21** දිනෙන් අවසන් වේ.

**5.7** අයදුම්පත්වල අපේක්ෂකයන්ගේ නම් ඇතුළත් කිරීමේදී උප්පැන්න සහතිකයේ සහ ජාතික හැඳුනුම්පතේ සඳහන් ආකාරයටම විය යුතු අතර ජාතික හැඳුනුම්පත් අංකය සටහන් කිරීම අනිවාර්යය වේ. ප්‍රතිඵල ලබාදීමෙන් පසුව නාම සංශෝධන සඳහා කරන ඉල්ලීම්වලදී මුද්‍රණ දෝෂ හැරුණු විට වෙනත් ඉල්ලීම් සම්බන්ධව සලකා බලනු නොලැබේ. අයදුම්පත් පැහැදිලිව ද නිවැරදිව ද සම්පූර්ණ කළ යුතුය. එසේ නොවන අයදුම්පත් සහ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**5.8** විභාගයට ඉදිරිපත් කරන සියලුම අයදුම්කරුවන් විසින් අයදුම්පතේ සඳහන් සම්පූර්ණ කර ඇති තොරතුරු පෞද්ගලිකව පරික්ෂාකර බලා අත්සන් කළ යුතු අතර සියලු අයදුම්කරුවන්ගේ ජාතික හැඳුනුම්පතේ පිටපතක් විභාග ප්‍රතිඵල නිකුත් කරන තෙක් අහදියියා දහම් පාසලේ විදුහල්පතිවරයා ළඟ තබා ගත යුතු ය.

**5.9** අයදුම්කරුවන්ගේ අදාළ සහතික පිළිබඳවත්, සුදුසුකම් ලබා තිබීම පිළිබඳවත්, අයදුම්පත් සහතික කරන විදුහල්පතිවරයා වගකිව යුතු ය.

**5.10** ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් නිකුත් කර ඇති අහදියියා දහම් පාසලේ / අරාබි විදුහලේ පරිගණක අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු අතර, අහදියියා දහම් පාසලේ / අරාබි විදුහලේ ලිපිනය වෙනස් වී නම් එය දැන්විය යුතු අතර අහදියියා දහම් පාසලේ / අරාබි විදුහලේ විදුහල්පතිවරයා සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකය ද සඳහන් කරන්න.

**5.11** අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් "විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තතමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට එවිය යුතුවේ. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ. අයදුම්පත බහා එවන කවරයේ වමත්පස කෙළවරේ "ඉස්ලාම් දීනියාත් (ධර්මාචාර්ය) සහතික පත්‍ර විභාගය - 2025 (2026)" යනුවෙන් ද ඉල්ලුම් කරන නගරය ද සඳහන් කළ යුතු ය.

**5.12** තැපෑලේ දී යම් අයදුම්පතක් නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබෙන අතර අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් පිළිබඳ වගකීම අහදියියා දහම් පාසල් / අරාබි විදුහල් ප්‍රධානීන් විසින් භාර ගත යුතු ය.

**06.** විභාග ගාස්තු :- මෙම විභාගය සඳහා නියමිත විභාග ගාස්තුව **රු. 200/-කි.** එහෙත් ප්‍රථම වතාවට ඉදිරිපත් වන අයදුම්කරුවන් මෙම විභාග ගාස්තුවෙන් නිදහස් කරනු ලැබේ. ඌන සාමාර්ථය සම්පූර්ණ කිරීමට අයදුම්කරන විෂයය සඳහා විභාග ගාස්තු **රු. 50/-කි.**

**6.1** විභාග ගාස්තු ගෙවීම :- අදාළ අහදියියා දහම් පාසලේ විදුහල්පති විසින් / අරාබි විදුහලේ විදුහල්පති විසින් විභාග ගාස්තු ගෙවීමට නියමිත සියලුම අයදුම්කරුවන්ගෙන් විභාග ගාස්තු එකතු කර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආදායම් ශීර්ෂ අංක **20-03-02-13**ට බැරවන සේ දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට එම සම්පූර්ණ මුදල ගෙවා ලදුපතක් ලබාගෙන එම ලදුපත අයදුම්පතේ පසු පිටේ නොගැලවෙන සේ අලවා එවිය යුතු ය. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

**6.2** කුමන කරුණක් නිසාවත් මෙම විභාගය සඳහා ගෙවන ගාස්තු වෙනත් විභාගයකට මාරු කිරීම හෝ ආපසු ගෙවීමක් හෝ සිදු කරනු නොලැබේ.

**07.** විභාග ප්‍රවේශ පත්‍ර :- විභාගයට ඇතුළත් කර ගන්නා සෑම අයදුම්කරුවකු වෙතම, විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍රයක්, අයදුම්පත් ඉදිරිපත් කළ අහදියියා දහම් පාසලේ විදුහල්පති වෙත හෝ අරාබි විදුහලේ විදුහල්පති වෙත නිකුත් කරනු ඇත.

**7.1** විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවකුම ස්වකීය විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගෙන විභාගයට පෙනී සිටින ප්‍රථම අවස්ථාවේදීම විභාග ශාලාධිපති වෙත භාර දිය යුතු ය. යම් අයදුම්කරුවකු තම විභාග ප්‍රවේශ පත්‍රය භාර නොදී සිටී නම් හෝ විභාග කොමසාරිස් ජනරාල් විසින් තමාට නියම කරන විභාග මධ්‍යස්ථාන හැර වෙනත් විභාග මධ්‍යස්ථානයක දී විභාගයට පෙනී සිටී නම් ඔහුගේ හෝ ඇයගේ හෝ විභාග අපේක්ෂකත්වය අහෝසි කරනු ඇත.

**7.2** ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන, අහදියියා දහම් පාසලේ විදුහල්පති / අරාබි විදුහලේ විදුහල්පති විසින් හෝ ග්‍රාම නිලධාරි විසින් සහතික කළ යුතු ය.

**7.3** විභාගය පැවැත්වීමට දින 07කට පෙර විභාග ප්‍රවේශ පත්‍ර නොලැබුණහොත් එම අහදියියා දහම් පාසලේ විදුහල්පති / අරාබි විදුහලේ විදුහල්පති විසින් ඒ බව නොපමාව විභාග කොමසාරිස් ජනරාල් වෙත දැන්විය යුතු ය. එවැනි සෑම අවස්ථාවකම පහත සඳහන් විස්තර සැපයිය යුතු ය.

1. විභාගයේ නම
2. අහදියියා දහම් පාසලේ / අරාබි විදුහලේ නම හා දුරකථන අංකය
3. අහදියියා දහම් පාසලේ / අරාබි විදුහලේ ලිපිනය
4. අහදියියා දහම් පාසලට / අරාබි විදුහලට ලබාදී ඇති පරිගණක අංකය
5. අයදුම්කරුගේ සම්පූර්ණ නම
6. අයදුම් කළ විභාග මධ්‍යස්ථානය / නගරය
7. අයදුම්පත තැපැල් කළ තැපැල් කාර්යාලය
8. අයදුම්පත ලියාපදිංචි කළ කුවිතාන්සිය
9. විභාග ගාස්තු ගෙවා ඇත්නම් එම ලදුපතේ පිටපත

**08.** අනන්‍යතාව :- විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

- ❖ ජාතික හැඳුනුම්පත;
- ❖ වලංගු විදේශ ගමන් බලපත්‍රය;
- ❖ වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණු ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කරගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

**09.** විභාග පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

**10.** සමත් බව තීරණය කිරීම හා ප්‍රතිඵල නිකුත් කිරීම :-

මෙම විභාගය සඳහා නියමිත විෂය ගණන පහක් (05) වන අතර, විභාගයෙන් සාමාර්ථය ලැබීම සඳහා සෑම විභාග අපේක්ෂකයකුම එම විෂයයන් පහම සමත් විය යුතු ය. කෙසේ වෙතත් එක් වතාවකදී අදාළ විෂයයන් පහෙන් එක් විෂයයක් පමණක් අසමත් නම් එය ඌන සාමාර්ථයක් ලෙස සලකනු ලැබේ. විභාගයට පෙනී සිටි වර්ෂයේ සිට අනුගාමී ඉදිරි විභාග වර්ෂ දෙක (02) ඇතුළත දී එම ඌන සාමාර්ථය ලැබූ විෂයය සඳහා නැවත පෙනී සිට එය සමත්

වී ඌන සාමාර්ථය සම්පූර්ණ කළ යුතු ය. ඌන සාමර්ථ්‍යය ලබන සිසුන් ඌන සාමාර්ථය සම්පූර්ණ කිරීමේදී විභාගයට පෙනී සිටිය යුත්තේ අනිවාර්යයෙන්ම ඌන සාමාර්ථය ලැබූ විෂයයට පමණි.

**10.1 සෑම විෂයයකම එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 100ක් හිමිවන අතර සමත්වීමේ ශ්‍රේණිවලට අදාළ ලකුණු පරාස සහ සංකේත පහත දැක්වේ :-**

| *ලකුණු පරාසය* | *ශ්‍රේණිය* | *සංකේතය* |
|---|---|---|
| 0-34 | අසමත් | F |
| 35-54 | සමත් | S |
| 55-69 | සම්මාන | C |
| 70-100 | විශිෂ්ට සම්මාන | D |

**10.2 අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ලැයිස්තුව අදාළ අහදියියා දහම් පාසලේ විදුහල්පති** / අරාබි විදුහලේ විදුහල්පති වෙත තැපැල් මගින් එවනු ලැබේ.

**10.3** විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

**11.** සහතික පත්‍ර :- මෙම විභාගයෙන් සමත් වන සෑම අයදුම්කරුවකුටම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සහතික පත්‍රයක් නිකුත් කිරීමට විධිවිධාන යොදනු ලැබේ. අදාළ සහතික පත්‍ර අහදියියා දහම් පාසල් විදුහල්පති / අරාබි විදුහලේ විදුහල්පති වෙත තැපැල් මගින් එවනු ලැබේ. විභාගය සමත්ව එහෙත් සහතික පත්‍රයක් නොලැබුණු යම් අපේක්ෂකයකු වේ නම්, ඒ පිළිබඳ අහදියියා දහම් පාසල් විදුහල්පති මගින් හෝ අරාබි විදුහලේ විදුහල්පති මගින් “විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග ප්‍රතිඵල ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල” යන ලිපිනයෙන් ලිඛිතව විමසීම් කළ යුතු ය.

**12.** උත්තර පත්‍ර නැවත සමීක්ෂණය :- අහදියියා දහම් පාසල් විදුහල්පති / අරාබි විදුහලේ විදුහල්පතිගේ ඉල්ලීම මත පමණක් උත්තර පත්‍ර නැවත සමීක්ෂණයට ඉඩදෙනු ලැබේ. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන ආකෘති පත්‍රයකින්, විභාග ප්‍රතිඵල නිකුත් වී දින 30ක් ඇතුළත නැවත සමීක්ෂණය සඳහා ඉල්ලුම් කළ හැකිය. මේ සඳහා වන ගාස්තු වරින් වර සංශෝධනය වීමට ඉඩ ඇති බැවින් එය අදාළ අයදුම්පතෙහි දක්වනු ලැබේ. කවර හේතුවක් නිසාවත් අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට හෝ උත්තර පත්‍ර පරීක්ෂා කිරීමට ඉඩදෙනු නොලැබේ.

**13.** විභාගය පිළිබඳ විස්තර :- මෙම විභාගය ප්‍රශ්න පත්‍ර පහකින් (05) සමන්විත වේ. එක් එක් ප්‍රශ්න පත්‍රයට අදාළ කාලය පැය තුනක් (03) බැගින් වේ. එම ප්‍රශ්න පත්‍ර පහත දැක්වේ.

1. අල් අකීදා වල් මසාදිරුෂ් ෂරීආ (ඉස්ලාමීය මූලධර්මය හා නීති මූලාශ්‍ර)
2. අල් ෆික්හුල් ඉස්ලාම් (ඉස්ලාමීය නීති පද්ධතිය)
3. අස්සීරා වත්තාරිකුල් ඉස්ලාම් (සීරා සහ ඉස්ලාමීය ඉතිහාසය)
4. අල් අඛ්ලාක් වස්සුලූක් (සමාජ ජීවිතය හා ආචාර ධර්ම)
5. අල් ලුකතුල් අරබියියා වල් අදබුල් ඉස්ලාම් (ඉස්ලාමීය සාහිත්‍යය සහ අරාබි බස)

**14.** ප්‍රශ්න පත්‍ර ව්‍යුහය :-

❖ එක් එක් ප්‍රශ්න පත්‍රය, I වැනි කොටස, II වැනි කොටස, III වැනි කොටස යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ.

❖ I වැනි කොටස සඳහා කෙටි පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න 10කින් සමන්විත වන අතර, ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය. එක් එක් ප්‍රශ්නයට ලකුණු 04 බැගින් හිමි වේ. (ලකුණු 04 × 10 = 40)

❖ II වැනි කොටස සඳහා ව්‍යුහගත ප්‍රශ්න 05කින් සමන්විත වේ. ඉන් කැමති ප්‍රශ්න හතරකට (04) එක් එක් ප්‍රශ්නයට ලකුණු 12 බැගින් හිමි වේ. (ලකුණු 12 × 04 = 48)

❖ III වැනි කොටස සඳහා රචනා වර්ගයේ ප්‍රශ්න දෙකක් (02) අඩංගු වේ. ඉන් කැමති එක් ප්‍රශ්නයකට පිළිතුරු සැපයිය යුතු ය. මෙම කොටස සඳහා ලකුණු 12ක් හිමි වේ. (ලකුණු 12 × 01 = 12)

**15.** විෂය නිර්දේශය :-

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කොට පැවැත්වීමට නියමිත ඉස්ලාම් දීනියාත් (ධර්මාචාර්ය) සහතික පත්‍ර විභාගයට අදාළ විෂය නිර්දේශය **උපලේඛනය - 02 ලෙස මෙම නිවේදනය අවසානයේ දක්වා ඇත.**

**16.** මූලාකෘති ප්‍රශ්න පත්‍ර :-

මූලාකෘති ප්‍රශ්න පත්‍ර සඳහා “අධ්‍යක්ෂ, මුස්ලිම් ආගමික හා සංස්කෘතික දෙපාර්තමේන්තුව, 180, ටී.බී. ජයා මාවත, කොළඹ 10.” යන ලිපිනයෙන් හෝ 011-2667909 / 011-2669994 විමසන්න.

**17.** මෙම නිවේදනයේ දක්වා ඇති විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීමට සියලුම විභාග අයදුම්කරුවන් බැඳී සිටින අතර, මෙහි විධිවිධාන සලසා නැති කවර හෝ යම් කරුණක් වෙතොත් එය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි තීරණය වනු ඇත.

**18.** සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**ඒ.කේ.එස්. ඉන්දිකා කුමාරි ලියනගේ,**
විභාග කොමසාරිස් ජනරාල්.

**2026 අගෝස්තු මස 21 වැනි දින,**
බත්තරමුල්ල, පැලවත්ත,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය - 01**

| *දිස්ත්‍රික්ක අංකය හා දිස්ත්‍රික්කය* | *නගර අංකය* | *නගරය* |
|---|---|---|
| **01 - කොළඹ** | **101** | කොළඹ |
| **02 - ගම්පහ** | **201** | මීගමුව |
| **03 - කළුතර** | **301** | කළුතර |
| **04 - මහනුවර** | **401** | මහනුවර |
| **05 - මාතලේ** | **501** | මාතලේ |
| **06 - නුවරඑළිය** | **601** | නුවරඑළිය |
| **07 - ගාල්ල** | **701** | ගාල්ල |
| **08 - මාතර** | **801** | මාතර |
| **09 - හම්බන්තොට** | **901** | හම්බන්තොට |
| **10 - යාපනය** | **1001** | යාපනය |
| **11 - මන්නාරම** | **1101** | මන්නාරම |
| **12 - වව්නියාව** | **1201** | වව්නියාව |
| **13 - මුලතිව්** | **1301** | මුලතිව් |
| **14 - කිලිනොච්චි** | **1401** | කිලිනොච්චි |
| **15 - මඩකලපුව** | **1501** | කාත්තන්කුඩි |
| **16 - අම්පාර** | **1601** | අක්කරෙයිපත්තු |
| **17 - ත්‍රිකුණාමලය** | **1701** | කින්නියා |
| **18 - කුරුණෑගල** | **1801** | සියඹලාගස්කොටුව |
| **19 - පුත්තලම** | **1901** | පුත්තලම |
| **20 - අනුරාධපුරය** | **2001** | අනුරාධපුරය |
| **21 - පොළොන්නරුව** | **2101** | පොළොන්නරුව |
| **22 - බදුල්ල** | **2201** | බදුල්ල |
| **23 - මොනරාගල** | **2301** | බිබිල |
| **24 - රත්නපුර** | **2401** | රත්නපුර |
| **25 - කෑගල්ල** | **2501** | කෑගල්ල |

උපලේඛනය - 02

**01. අල් අකීදා වල් මසාදිරුෂ් ෂරීආ (ඉස්ලාමීය මූලධර්මය හා නීති මූලාශ්‍ර)**

1.1 ඉස්ලාමීය අකීදා

1.1.1 ඉස්ලාමීය අකීදා - හැඳින්වීම හා සාමාන්‍ය අවබෝධය

1.1.2 ඉස්ලාමීය අකීදා හි අන්තර්ගතය

1.1.2.1 තව්හීද්
- අල් උලූහියියා
- අල් රුබූබියියා
- අස්මාඋල් හුස්නා තුළින් අල්ලාහ්ගේ ස්වභාව අවබෝධ කර ගැනීම

1.1.2.2 රූහානියියාත්

1.1.2.3 නුබුව්වත්

1.1.2.4 සම්ඉයියාත්

1.1.2.5 කලා කද්ර්

1.1.3 අකීදා ආශ්‍රිත කොටස්

1.2 මසාදිරුෂ් ෂරීආ

1.2.1 මසාදිරුන් නක්ලියියා - හැඳින්වීම

1.1.2 වහි
- වහි හි අවශ්‍යතාව
- වහි වර්ග

1.2.3 අල් කුර්ආන්

1.2.3.1 - පහළවීම හා ගොනු කරනු ලැබීම
- තර්තීබ් නුසුල්
- තර්තීබ් තිලාවත්

1.2.3.2 - ව්‍යුහය
- මක්කි මදනි
- නාසික් මන්සුක්
- මුහ්කම්
- මුතෂාබිහ්
- අස්බාබුන් නුසුල්

1.2.3.3 - ඉඃජාසුල් කුර්ආන්
- භාෂාව පදනම් කර ගත් මූලික
- නීති මූලික
- විද්‍යා මූලික

1.2.3.4- තෆ්සීර් විද්‍යාව
- ආරම්භය හා වර්ධනය
- තෆ්සීර් වර්ග (මන්කූල්, මඃකූල්, නූතන තෆ්සීර් වර්ග)

1.2.3.5 - අල්කුර්ආන් හා සම්බන්ධතාව
- අල් කුර්ආනයට ළඟාවන ආකාරය
- අල් කුර්ආනයේ පරමාර්ථ
- අල් කුර්ආනයේ හදාරන ආකාරය

1.2.4 අස්සුන්නා

1.2.4.1 - පදාර්ථය හා ව්‍යවහාරික විස්තර

1.2.4.2 - නීති මූලාශ්‍රයක් වශයෙන් සුන්නාව

1.2.4.3 - හදීස් සංරක්ෂණය
- නබි (සල්) තුමාගේ කාලය
- සහාබාවරුන්ගේ අවධිය
- තාබිඊන්වරුන්ගේ අවධිය
- තාබ්උත්තාබිඊන්වරුන්ගේ අවධිය
- නූතන අවධිය

1.2.4.4 - හදීස් ආශ්‍රිතව බිහිවූ විද්‍යාවන් හා ඒවායේ ප්‍රතිඵල
- අස්මාඋර් රිජාල්
- ඉල්මුර් ජරාහ් වත්තඃතීල්
- උසූලූල් හදීස්

1.2.4.5 - හදීස් අවබෝධ කර ගැනීම
- හදීස් සමස්ථ ජීවිතයටම මග පෙන්වීමක්
- හදීස් ග්‍රන්ථ

1.2.4.6 - හදීස් වෙත ළගාවීම
- විවිධ ක්ෂේත්‍රවලට අදාළ හදීස් අවබෝධ කරගැනීම (පරිසරය සංරක්ෂණය, සෞඛ්‍ය ආරක්ෂාව, ආර්ථිකය, විද්‍යාව)

1.2.5 සහායක මූලාශ්‍ර

1.2.5.1 - ඉජ්තිහාද්
- පදාර්ථය හා ව්‍යවහාර විස්තරය
- ඉජ්තිහාදයේ අවශ්‍යතාව
- නීති ගුරුකුලයන්
- (මද්රසතුල් අසර් මද්රසතුර්රඋයු)

1.2.5.2 - මුජ්තහිද්වරුන්
- සුදුසුකම් හා වර්ග
- ඔවුන්ගේ දායකත්වය
- මද්හබ් බිහිවීම හා වර්ධනය

1.2.5.3 - සහායක මූලාශ්‍ර
- යාන්ත්‍රණ හා යෙදවුම්
- ඉජ්මා, කියාස්, මස්ලහා, මුර්සලා, උර්ෆ්, ෂරඋ, සාබිකා, ඉස්තිහ්සාන්, ඉස්තිස්හාබ්, කව්ලුල්සහාබා, සද්දුස් සරාඉ

**02. අල් ෆික්හුල් ඉස්ලාම් (ඉස්ලාමීය නීති පද්ධතිය)**

2.1 ඉබාදත්

2.1.1 තහාරත්
- නජීස් පිළිබඳ විස්තර

2.1.2 ඉබාදත්
- පදාර්ථය හා ව්‍යවහාරය
- ඉබාදත් වර්ග හා එහි මූලධර්ම
- ඊමාන් හා ඉබාදතය අතර සබඳතාව

2.2 මූලික ඉබාදතයන්

2.2.1 සලාතය
- වැදගත්කම
- වර්ග
- පිළිවෙත්
- ප්‍රයෝජන

2.2.2 සකාත්
- වැදගත්කම
- පිළිවෙත්
- ප්‍රයෝජන
- සකාතය ආයතනගත කිරීමේ අවශ්‍යතාව
- සකාතුල් ෆිත්ර්

2.2.3 සව්මය
- වැදගත්කම වර්ග
- පිළිවෙත්
- ප්‍රයෝජන

2.2.4 අල්හජ්
- වැදගත්කම
- පිළිවෙත්
- ප්‍රයෝජන

2.2.5 සෙසු ඉබාදතයන්
- සදකා
- උම්රා
- තිලාවතුල් කුර්ආන්
- තව්බා ඉස්තිඃපාර්
- දික්ර් අව්රාද් දුආ
- කව්ෆ්, රජා, රීලා, තවක්කුල්, වරඋ, සුහ්ද්
- සියාරතුල් කුබූර්
- කුර්බානීන්

2.3 මුආමලාත්

2.3.1 ඉස්ලාමීය ආර්ථිකය
- හැඳින්වීම
- සුවිශේෂ ලක්ෂණ

2.3.2 ඉපැයීම හා වියදම් කිරීම
- ඉපැයීමේ වැදගත්කම
- කෘෂිකර්මය (මුසාරආ - ඉහ්යාඋල් මමාත්)
- කර්මාන්ත

2.3.3 වෙළඳාම
- වැදගත්කම
- ඉස්ලාම් අනුමත කර ඇති වෙළඳාම් ක්‍රම (සම්සරා බෛඋත් තක්සීද්, මුලාරබා, මුෂාරකා, මුරාබහා, ඉජාරා, රහ්න්)
- නූතන වෙළඳාම් ක්‍රම (අනෙකුත් වෙළඳාම් ක්‍රම හා සැසඳීම) නිදසුන් : බැංකු, රක්‍ෂණය)

2.3.4 ඉස්ලාමිහි තහනම් (හරාම්) කර ඇති ව්‍යාපාර කටයුතු
- බාල කිරීම
- සගවා තැබීම්
- රැවැට්ටීම
- අල්ලස
- සූදුව
- පොළිය
- හරාම් වූ ද්‍රව්‍ය විකිණීම

2.4 මුනාකහාත්

2.4.1 නිකාහ්
- නිකාහ් පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ඨී කෝණය
- නිකාහ්
- නීති රීති
- බහු භාර්යා විවාහය

2.4.2 පවුල
- පවුල් ජීවිතයේ වැදගත්කම
- අඹු සැමි සබඳතා
- වගකීම් හා අයිතිවාසිකම්
- දරුවන් හදාවඩා ගැනීම පිළිබඳ උපදෙස් හා මගපෙන්වීම්
- පශ්චාත් හිමිකම්/දෙමාපියන් හා දරුවන්ගේ වගකීම් හා අයිතිවාසිකම්

2.4.3 දික්කසාදය
- දික්කසාදය පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ඨී කෝණය
- වර්ග හා පිළිවෙත්
- ඉද්දා විස්තරය නීති රීති නඩත්තුව 2.5 ජිනායාත්

03. අස්සීරා වත්තාරිකුල් ඉස්ලාම් (සීරා සහ ඉස්ලාමීය ඉතිහාසය)

3.1 ඉතිහාසය පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ඨී කෝණය ඉස්ලාමීය ඉතිහාසයේ සුවිශේෂ ලක්ෂණ

3.2 ඉතිහාස අවධි

3.2.1 නබි (සල්) තුමන්ගේ අවධිය - නබි (සල්) තුමාට පෙර අවධිය
- නබි (සල්) තුමාගේ මක්කා ජීවිත කාල පරිච්ඡේදය
- නබි (සල්) තුමාගේ මදීනා ජීවිත කාල පරිච්ඡේදය

3.2.2 කුලෆාඋර්රාෂිදින්වරුන්ගේ කාල පරිච්ඡේදය
- කලීෆාවරුන් තෝරා පත් වූ ආකාරය
- රාජ්‍ය විකාශයට තුඩුදුන් හේතුන් සහ විකාශ වූ ආකාරය
- පාලන, මුල්‍ය, අධිකරණ ආයතන
- මුහුණදුන් අභියෝග
- කලීෆාවරුන්ගේ පෞරුෂ ලක්‍ෂණ හා ආදර්ශ

3.2.3 පසු කාලීන කලීෆාවරුන්ගේ කාල පරිච්ඡේදය

3.2.3.1 උමයියා අවධිය
- උමයියාවරුන්ගේ පිබිදීම
- ප්‍රධාන කලීෆාවරු
- පෞරුෂ ලක්ෂණ හා දායකත්වය (මු. ආවියා, අබ්දුල් මලික්, වලීද්, උමර් ඉබ්නු අබ්දුල් අසීස්)
- රාජ්‍ය විකාශය එහි ප්‍රතිඵල
- මුහුණදුන් ගැටලු

3.2.3.2 අබ්බාසිවරුන්ගේ කාල පරිච්ඡේදය
- අබ්බාසිවරුන්ගේ පිබිදීම
- ප්‍රධාන කලීෆාවරු හා දායකත්වය (මන්සූර්, හාරූන්, ම:මුන්) පසු කාලීන කලීෆාවරුන්ගේ පාලනය
- කුලෆාඋර්රාෂිදින්වරුන්ගේ පාලනය හා සැසඳීම

3.2.3.3 අනෙකුත් රාජ්‍යයන්
- ස්පාඤ්ඤයේ උමයියා පාලනය
- ඉන්දියාවේ මෝගල් පාලනය
- තුර්කියෙහි උස්මානිය පාලනය

3.2.3.4 වර්තමාන මුස්ලිම් ලෝකය

3.3 ඉස්ලාමීය කලාවන්

3.3.1 විද්‍යාත්මක කලාවන්
- විද්‍යාත්මක කලාවන් පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ඨී කෝණය
- පහත දැක්වෙන කලාවන්හි වර්ධනය හා නිර්මාණාත්මක
- දායකත්වය : දර්ශනය, වෛද්‍ය විද්‍යාව, ඉතිහාසය, ගණිතය, භූගෝල විද්‍යාව, තාරකා විද්‍යාව

3.3.2 සෞන්දර්යාත්මක කලාවන් - සෞන්දර්යාත්මක කලාවන්
- සෞන්දර්ය කලා පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ඨී කෝණය
- පහත දැක්වෙන කලාවන් බිහිවීම සහ වර්ධනය (කිරාඅත් කලාව, කැලිග්‍රාෆි අක්ෂර කලාව අරබෙස්ක්
- වාස්තු විද්‍යාව, මිනියේචර් කලාව සංගීත කලාව)

3.4 ඉස්ලාමීය ඉතිහාසයේ මස්ජිද්වල දායකත්වය මස්ජිද් බිහිවීම හා එහි කාර්යයන් පහත සඳහන් මස්ජිද් බිහිවීම හා ඒවායෙහි වැදගත්කම මස්ජිදුල් හරම් - මස්ජිදුන් නබවි - මස්ජිදුල් අක්සා

3.5 ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය

3.5.1 අරාබිවරුන්ගේ පැමිණීම

3.5.2 ශ්‍රී ලංකාවේ ඉස්ලාම් හඳුන්වා දෙනු ලැබීම

3.5.3 ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්
- ජනගහන විකාශය හා පැරණි සහ නව ජනාවාස
- ජාතික මටට්මේ දායකත්වය

3.5.4. ආගමික හා සමාජීය ආයතන - මස්ජිද්
- මුස්ලිම් පුද්ගල නීතිය
- වක්ෆු විවාහය බිඳීම පිළිබඳ නීති රීති
- ක්වාසි අධිකරණය හා අභියාචනා ක්වාසි සභාව
- මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

3.6 ඓතිහාසික මුස්ලිම් පෙර ගමන්කරුවන්

3.6.1 සහාබාවරුන් (මුස්අබ් ඉබ්නු උමෛර් (රලි) බිලාල් (රලි), සෛද් ඉබ්නු සබිද් (රලි) දුල් බිජාදෛන්(රලි) උම්මු අමාරා (රලි), අස්මා බින්ති අබුබක්කර්(රලි) ෆාතිමා (රලි)

3.6.2 තාබිරීන්වරුන් ඉමාම්වරුන් (උමර් ඉබ්නු, අබ්දුල්අසීස්, සායිද් ඉබ්නු මුසෛද් අතා ඉබ්නු අබි රබාහ්, ඉමාම් සුහ්රි)

3.6.3 චින්තකයින්, ප්‍රතිසංස්කරණවාදීන්, අබ්දුල් කාදීර් ජීලිනි, ඉමාම් ගස්සාලි, අබුල් හසන් ෂාදුලි, ඉබ්නුල් කෙයුම් අල් ජව්සි මුහම්මද් ඉබ්නු අබ්දුල් වහ්හාබ්, මෞලානා ඉල්යාස්, ඉමාම් හසනුල් බන්නා, මෞලානා මෞදූදි

04. අල් අඛ්ලාක් වස්සුලූක් (සමාජ ජීවිතය හා ආචාර ධර්ම)

4.1 සමාජ ජීවිතය

4.1.1 හැඳින්වීම
- මිනිසා, විශ්වය, ජීවිතය පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ඨී කෝණය

4.1.2 පුද්ගලයා
- සමාජයේ පුද්ගලයාගේ දායකත්වය
- සමාජය කෙරෙහි පුද්ගලයාගේ වගකීම්

4.1.3 පවුල
- පුද්ගලයා සහ පවුල
- මුස්ලිම් සමාජයීය ක්‍රමයේ පුද්ගලයාගේ කාර්ය භාරය
- පුද්ගලයා ගොඩනැංවීමෙහිලා පවුලේ දායකත්වය හා කාර්ය භාරය
- ඥාති සබඳතා
- ඥාතින් හා අසල්වැසියන්

4.1.4 සමාජය
- ඉස්ලාමීය සමාජ ව්‍යුහයේ ලක්ෂණ (සමානාත්මතාව සහෝදරත්වය, නිදහස, යුක්තිය)
- පුද්ගලයා සහ සමාජය (අයිතිවාසිකම්)
- යහ ක්‍රියා වර්ධනය කිරීම
- අයහපත් ක්‍රියා වැළැක්වීම
- ඉස්ලාමීය පුහුණුකරුවන්ගේ ලක්ෂණ හා කාර්යභාරය
- බහු වාර්ගික සමාජයෙහි මුස්ලිම්වරුන්ගේ සබඳතාව
- දුබලයින්ට ආරක්ෂාව
- කියා සඳහා මාර්ගෝපදේශ
- සමාජ ආචාරධර්ම (ඉවසා දරා ගැනීම, නම්‍යශීලී බව, තවාසුන්, නායකත්වයට ගරු කිරීම, සමාජ සන්නිවේදනය)
- සමාජ සබඳතාව තහවුරු කරන හා දුර්වල කරන කරුණු

4.2 ආචාර ධර්ම

4.2.1 අල්ලාහ් සමග සබඳතා
- ඉඛ්ලාස්
- තක්වා (දේව භක්තිය)
- තවක්කුල්
- අල්ලාහ්ගේ තීන්දුව සහ කැමැත්ත සතුටින් භාර ගැනීම
- අල්ලාහ් කෙරෙහි දයාව දැක්වීම
- කෙළෙහිගුණ දැක්වීම

4.2.2 මිනිස් සබඳතා සමාජ ආචාරධර්ම
- සහෝදරත්වය
- සත්‍යවන්තභාවය
- අවංකභාවය
- සමාව දීමේ ආකල්පය
- පාරිශුද්ධභාවය/පිරිසිදුකම
- සෙනෙහස
- ලැජ්ජාශීලි බව
- ඉවසීම

4.2.3 අනෙකුත් ජීවින් හා භෞතික වස්තූන් පිළිබඳ ආචාරධර්ම
- ජීවින් කෙරෙහි ආදරය දැක්වීම හා ඔවුන්ගේ සුභ සිද්ධියට කටයුතු කිරීම
- භෞතික පරිසරය සුරැකීම
- රටේ යහපත සුරැකීම
- ආපදා කළමනාකරණය

**05. අල් ලුකතුල් අරබියියා වල් අදබුල් ඉස්ලාමි (ඉස්ලාමීය සාහිත්‍යය අරාබි බස)**

5.1 ඉස්ලාමීය සාහිත්‍යය

5.1.1 ඉස්ලාමීය සාහිත්‍යයේ සංකල්ප හා මූලධර්ම නූතන ඉස්ලාමීය සාහිත්‍ය හැඳින්වීමක්

5.2 පහත දක්වා ඇති අය ඉස්ලාමීය සාහිත්‍යට දැක්වූ දායකත්වය

දෙමළ භාෂා මාධ්‍යයෙන් :-
- එම්. සී. සිද්දි ලෙබ්බෙ
- ආචාර්ය එම්. එම්. උවයිස්
- ඒ. එම්. ඒ. අසීස්
- උමර් හස්රත්
- යූ. එම්. තාසීම්
- අබ්දුල් කාදර් ලෙබ්බෙ කවියා

සිංහල භාෂාව තුළින් :-
- ආචාර්ය එම්. එම්. උවයිස්
- එස්. එම්. මන්සූර්
- ඒ. එම්. ෂාහුල් හමීද්
- එම්. එම්. එම්. ෂම්ස්
- එම්. ඒ. මුහම්මද් මාස්ටර් (දික්වැල්ල)
- මාතර කාසිම් කවියා

5.3 අරාබි දෙමළ

5.3.1 අරාබි දෙමළ
- හැඳින්වීම අරාබි දෙමළ
- ආරම්භය හා වර්ධනය

5.3.2 පහත කෘති පිළිබඳ අවබෝධය
- ෆක්හුද්දයියාන්
- ආලිමුල් අරූස්
- තෆ්සීර් ජ් ෂෙයිකු මුස්තාෆා (බේරුවල)
- ඉබ්නු නුෆාදාගේ කුත්බා
- මීසාන් මාලේ
- තෙලෙ ෆාතිහා
- තක්කසූරුක්

5.4 අරාබි බස

5.4.1 භාෂා කුසලතා වර්ධනය
- සවන්දීම
- කථනය/කථා බහ
- කියවීම
- ලිවීම

5.4.2 එදිනෙදා ජීවිතයේ භාවිත කළ හැකි වදන් හා වාක්‍යාංශ
- කෙටි වාක්‍ය

5.4.3 අරාබිය සිංහලට හෝ දෙමළට හෝ ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම හා සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි අරාබියට පරිවර්තනය කිරීම

5.4.4 දෙන ලද ඡේදයට අදාළව අසන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම
- දෙන ලද ඡේදයට පිල්ලම් යෙදීම

5.4.5 අල්කුර්ආන්, සුන්නා සාහිත්‍ය රස විඳීම
- මුෆ් රදාතුල්, කුර්ආන්
- සිද්ධි වාචනය

5.4.6 අහ්කාමුත් දජ්වීද්
- තජ්වීද් නීති රීති

5.4.7 ව්‍යාකරණ පිළිබඳ දැනුම

5.4.7.1 අස්සරෆු - අතීත කාල වර්තමාන කාල ක්‍රියා
- උත්තම පුරුෂ, මධ්‍යම පුරුෂ, ප්‍රථම පුරුෂ ක්‍රියා
- ලිංග භේද, වචන භේද, බහු වචන ප්‍රභේද
- විධි ක්‍රියාව
- අතීත කාල, වර්තමාන කාල, කර්ම කාරක ක්‍රියා
- ක්‍රියා මූල (මස්කර්)
- ඉස්මු ෆාඉල් / ඉස්මු මෆ්ඌල්
- බහු වචන විවිධත්වය

5.4.7.2 අන්නහ්වු
- අල් මුෆ්තදා, වල් කෆර්
- අල් ෆිඅල් වල් ෆා ඉල්
- අස්මාඋල් ඉෂාරා
- අස්සිෆාත්
- හුරූෆුල් ජර්රු
- අල් මුලාෆ් වල් මුලාෆ් ඉලයිහි
- කාන වඅකවාතුහා
- ඉන්න ව අකවාතුහා
- අල් හාල්

## අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

### දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල සේවයේ නියුතු ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරින් සඳහා වන III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026

1.0 ඉහත සඳහන් සේවයට අයත් නිලධාරීන් සඳහා අදාළ අංක 2444/21 හා 2025.07.08 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් පළ කර ඇති ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ තෙවන සංශෝධනය සහ අංක 2493/61 හා 2026.06.19 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් පළ කර ඇති ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ සිව්වන සංශෝධනයේ විධිවිධානයන්ට අනුකූලව III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2026 දෙසැම්බර් මස පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මෙම විභාගය උපලේඛනය I හි සඳහන් නගරවල පිහිටුවන ලබන විභාග මධ්‍යස්ථානවලදී පමණක් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන ලද නගරය/නගර පසුව වෙනස් කිරීමට ඉඩ ලබා දෙනු නොලැබේ. කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම් කර නොමැති නම් එම අයදුම්කරුවන් ඔවුන්ගේ දෙවන මනාපය ලෙස දක්වන ලද නගරයේ හෝ ආසන්න වෙනත් නගරයක හෝ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ. තව ද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම් කර නොමැති නම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

අයදුම්පත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ “ Our Services” යටතේ ඇති “ Online Applications – Recruitment/ E.B. Exams” ඔස්සේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2026 අගෝස්තු මස 25 වැනි දින පෙ.ව. 09.00ට විවෘත වන අතර 2026 සැප්තැම්බර් මස 14 වැනි දින ප.ව. 09.00ට අවසන් වේ.** අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපත් දෙකක් (02) ලබාගෙන එම පිටපත් දෙකෙහි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ සහතිකය සමග ඉන් එක් පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කළ යුතුය. අනෙක් පිටපත අවශ්‍ය විටක ඉදිරිපත් කිරීම සඳහා තමන් භාරයේ තබා ගත යුතුය.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරා ගත යුතු ය.

2.0

I. මෙම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ.

II. විභාග අපේක්ෂකත්වය ලැබීම සඳහා පනවා ඇති නීති *ගැසට් පත්‍රයේ* වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුන්ට සිදුවනු ඇත.

III. මෙම විභාගය සඳහා අයදුම් කළ හැක්කේ ශ්‍රී ලංකා ගුරු සේවයේ සහ පළාත් රාජ්‍ය සේවාවල ගුරු සේවයේ පහත 12.0 මගින් දක්වන ලද නිලධාරින්ට පමණි.

IV. මෙම විභාගය සඳහා විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන් ඉදිරිපත් වන්නේ නම් ඒ බව අයදුම්පතේ අනිවාර්යයෙන් සඳහන් කළ යුතු අතර අදාළ වෛද්‍ය සහතිකවල පිටපත් අයදුම්පතේ මුද්‍රිත පිටපතක් සමඟ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

3.0 විභාග ගාස්තු:-

මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගය පළමු වරට පවත්වනු ලබන බැවින් ගාස්තු අය කරනු නොලැබේ.

4.0 අයදුම්පත් යොමු කිරීම:-

මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E -mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාග සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් නිවැරදිව පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.0 විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

6.0 *ගැසට්*නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත.

විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මඟින්/ අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දක්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් වෙබ් නිවේදනයේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත,ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතු ය. විභාග ශාලාවේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

7.0 අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ අදාළ කාර්යක්ෂමතා කඩඉම් අවශ්‍යතාව සම්පූර්ණ කර ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

8.0 විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතු ය. එවැනි ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

9.0 විභාග අයදුම්කරුවන් තමන්ට නියම කරන විභාග මධ්‍යස්ථානයේදී විභාගයට පෙනී සිටිය යුතු ය.

10.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකි වන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් අවශ්‍ය පරිදි රාජකාරි නිවාඩු ලබා දිය යුතු ය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

11.0 විභාගය පැවැත්වෙන්නේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පමණි. ඒ අතුරින් තම පත්වීම් විෂයයට අදාළ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකි අතර, පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයකටම පිළිතුරු සැපයිය යුත්තේ එකම මාධ්‍යයෙනි. අයදුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

12.0 ශ්‍රී ලංකා ගුරු සේවයේ සහ පළාත් රාජ්‍ය සේවාවල ගුරු සේවයේ 2 පන්තියේ I ශ්‍රේණියට උසස් වී වසර හතරක් (04) ගතවීමට පෙර III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කළ යුතුය. එම නිලධාරීන්ට අමතරව, 2-I ශ්‍රේණියට උසස්වීම් ලබා වසර 4 ක් ඉක්මවා ගිය ද, 2025.06.30 දිනෙන් පසු I වන ශ්‍රේණි උසස්වීම් යෙදෙන ගුරුවරුන් ද I ශ්‍රේණියට උසස්වීම් ලැබීම සඳහා III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ අවශ්‍යතාව සම්පූර්ණ කළ යුතු වේ.

13.0 විභාග පරිපාටිය -

13.1 ප්‍රශ්න සැකැස්ම :

අධ්‍යාපන විෂයභාර අමාත්‍යාංශය විසින් e-thaksalawa නිල වෙබ් අඩවියේ පළ කරන ලද පහත 13.2 හි දක්වා ඇති ස්වයං අධ්‍යයන මොඩියුල සම්බන්ධ විෂය නිර්දේශය ආශ්‍රයෙන් සකස් වේ. මෙම කාර්යක්ෂමතා කඩඉම සඳහා වන ලිඛිත පරීක්ෂණය එම අදාළ මොඩියුල සියල්ලම ආවරණය වන සේ පහත පරිදි පැවැත්වේ.

| *ව්‍යුහය* | *ප්‍රශ්න සැකැස්ම* | *කාලය* | *ලකුණු* |
|---|---|---|---|
| I පත්‍රය | බහුවරණ | පැය 01 | 40 |
| II පත්‍රය | ව්‍යුහගත ප්‍රශ්න හෝ අර්ධ ව්‍යුහගත ප්‍රශ්න | පැය 02 | 60 |

***සටහන 1*** - I පත්‍රය ලෙස විෂයානුබද්ධ දැනුම I පත්‍රය නිකුත් කරන අතර එය බහුවරණ ප්‍රශ්න 40 කින් වේ. II පත්‍රය ලෙස විෂයානුබද්ධ දැනුම II පත්‍රය නිකුත් කරන අතර එය අර්ධ ව්‍යුහගත ප්‍රශ්න 04 කින් සමන්විතය. එම ප්‍රශ්න පත්‍ර දෙකෙහිම අන්තර්ගත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

13.2 විභාගය සඳහා විෂය නිර්දේශය :

| *කාර්යක්ෂමතා කඩඉම* | *අදාළ වන මොඩියුල* |
|---|---|
| III වන කාර්යක්ෂමතා කඩඉම | 1. කායික හා මානසික යහපැවැත්ම |
| | 2. විසි එක්වන සියවසේ පාසල |
| | 3. ක්‍රියාමූලික පර්යේෂණ |

***සටහන 2*** - සාමර්ථ්‍යය සඳහා ඉහත 13.1 වගුව මඟින් දක්වන ලද I පත්‍රයේ සහ II පත්‍රයේ ලකුණුවල මුළු එකතුව 40% ක් හෝ ඊට වැඩිවන සේ ලබා ගත යුතු ය.

14.0 විභාග ප්‍රතිඵල නිකුත් කිරීම :- විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේ ක්‍රමවේදය පහත පරිදි වේ.

I. විභාගයට පෙනී සිටින සියලුම අයදුම්කරුවන්ගේ (ජාතික හා පළාත්) ප්‍රතිඵල පළාත් අනුව වෙන් වෙන් වශයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පිටපත් දෙකක් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කරනු ලබයි.

II. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කරනු ලබන එකී විභාග ප්‍රතිඵල ලේඛන පිටපත් දෙකෙන් එක් පිටපතක්; ජාතික හා පළාත් පාසල්වල සේවයේ නියුතු ගුරුවරුන්ගේ විභාග ප්‍රතිඵල සත්‍යාපනය කිරීමට හැකිවන පරිදි පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් කටයුතු කරනු ලැබේ.

III. එසේම, සියලුම ගුරු සේවයේ නිලධරයන්ගේ පත්වීම ස්ථිර කිරීමට හා ශ්‍රේණි උසස්වීම්වලට අදාළ වන කාර්යක්ෂමතා කඩඉම් විභාග ප්‍රතිඵල, විභාග දෙපාර්තමේන්තුව විසින් අයදුම්කරුට ද බාගත කිරීමට අවස්ථාව සලසා දෙනු ලැබේ. එසේ බාගත කර ගන්නා ප්‍රතිඵල ලේඛනය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත අයදුම්කරු විසින් ඉදිරිපත් කළ යුතු අතර, එම ප්‍රතිඵල ලේඛන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් සත්‍යාපනය කරගෙන අදාළ නිලධරයාගේ පුද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කළ යුතු ය.

IV. එකී සත්‍යාපනය කරන ලද ප්‍රතිඵල පදනම් කරගෙන පළාත්/කලාප අධ්‍යාපන බලධරයන් විසින් අදාළ ගුරුවරුන්ගේ පත්වීම ස්ථිර කිරීම හා ශ්‍රේණි උසස් කිරීම සඳහා අදාළ කටයුතු කළ යුතුවේ.

V. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

15.0 මෙම විභාග නිවේදනය මඟින් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

16.0 සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේනම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**නාලක කලුවැව,**
ලේකම්,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය.

2026 අගෝස්තු මස 17 වැනි දින
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය,
"ඉසුරුපාය"
බත්තරමුල්ල.

උප ලේඛනය I

| *දිස්ත්‍රික්කය / නගරය* | *දිස්ත්‍රික් / නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |

| *දිස්ත්‍රික්කය / නගරය* | *දිස්ත්‍රික් / නගර අංකය* |
|---|---|
| වවුනියාව | 12 |
| මුලතිව් | 13 |
| කිළිනොච්චිය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 20 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොනරාගල | 23 |
| රත්නපුර | 24 |
| කෑගල්ල | 25 |

08 - 283

---

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

බෞද්ධ ධර්මාචාර්ය සහතික පත්‍ර විභාගය - 2026

2024 හා 2025 වර්ෂවලට නියමිත බෞද්ධ ධර්මාචාර්ය සහතික පත්‍ර විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලබන අතර, විභාගය 2026 නොවැම්බර් මස පැවැත්වීමට කටයුතු යොදා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. විභාග මධ්‍යස්ථාන :- **උප ලේඛනය 01 හි** දක්වා ඇති සෑම දිස්ත්‍රික්කයකම අයදුම්කරුවන් සංඛ්‍යාව අනුව විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ඇත. එහෙත් යම් නගරයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන අවස්ථාවල දී එකී නගරයේ විභාග මධ්‍යස්ථානය අවලංගු කොට අදාළ අයදුම්කරුවන් ඊට ආසන්නව පිහිටි වෙනත් විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කිරීමට සිදුවනු ඇත.

**03. භාෂා මාධ්‍යය:-** මෙම විභාගය සිංහල හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පමණක් පවත්වනු ලැබේ. එහෙත් යම් අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු ලබන්නේ තමන් කැමති එක් භාෂා මාධ්‍යයකින් පමණි. අයදුම්පතේ සඳහන් කරන ලද භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

**04. සුදුසුකම් :-** මෙම විභාගය සඳහා අයදුම් කරන සෑම අයදුම්කරුවකුම පහත දක්වා ඇති සුදුසුකම් අතුරින් යටත් පිරිසෙයින් කවර හෝ එක් සුදුසුකමක් සපුරා තිබිය යුතු ය.

4.1 දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය සමත්ව සිටීම; *හෝ*

4.2 ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය සමත්ව සිටීම; *හෝ*

4.3 පිරිවෙන් අවසාන විභාගය සමත්ව සිටීම; *හෝ*

4.4 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් බුද්ධ ධර්මය සම්මාන සහිතව විෂයයන් 06කින් සමත්ව සිටීම

**05. අයදුම් කිරීම :-**

5.1 බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ 2025.11.06 වන දිනට ලියාපදිංචි දහම් පාසල්වලට අවශ්‍ය අයදුම්පත් හා උපදෙස් පත්‍රිකා තැපැල් මගින් මේ වන විට යොමු කර ඇති අතර www.donets.lk වෙබ් අඩවිය මගින් ද බාගත කර ගැනීමේ පහසුකම සලසා ඇත.

5.2 කවර හෝ පුද්ගලයකුට බාහිර අයදුම්කරුවකු වශයෙන් විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. එසේ වුවත් 04 වැනි ඡේදයේ සුදුසුකම් සපුරා ඇති යම් විභාග අපේක්ෂකයකු වේ නම් තමන් පදිංචි ස්ථානයට ආසන්න දහම් පාසල මගින් රු. 200/-ක විභාග ගාස්තුවක් ගෙවා විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ හැකිය. මේ සඳහා අවශ්‍ය උපදෙස් සියලුම දහම් පාසල් ප්‍රධානීන් වෙත ලබා දෙනු ඇත.

5.3 අදාළ දහම් පාසල් ප්‍රධානීන් විසින්ම ඉදිරිපත් කළ යුතු මෙම අයදුම්පත් පිටපත් දෙකකින් යුක්තව සකස් කර මුල් පිටපත විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු අතර දෙවන පිටපත ප්‍රධානාචාර්යවරයා වෙත තබා ගත යුතු ය. අයදුම්පත් දෙකෙහිම ප්‍රධානාචාර්යවරයා අත්සන් කර තිබිය යුතු ය.

5.4 මෙම විභාගය සඳහා විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන් ඉදිරිපත් වන්නේ නම් ඒ බව අයදුම්පතේ අනිවාර්යයෙන් සඳහන් කළ යුතු අතර අදාළ වෛද්‍ය සහතිකවල පිටපත් අයදුම්පතේ මුද්‍රිත පිටපතක් සමග ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

5.5 අයදුම්පත් භාර ගැනීම **2026 අගෝස්තු මස 21** දිනෙන් ආරම්භවී **2026 සැප්තැම්බර් මස 21** දිනෙන් අවසන් වේ.

5.6 අයදුම්පත්වල අපේක්ෂකයන්ගේ නම් ඇතුළත් කිරීමේ දී ජාතික හැඳුනුම්පතේ සඳහන් ආකාරයටම විය යුතු අතර ජාතික හැඳුනුම්පත් අංකය සටහන් කිරීම අනිවාර්ය වේ. ප්‍රතිඵල ලබාදීමෙන් පසුව නාම සංශෝධන සඳහා කරන ඉල්ලීම්වලදී මුද්‍රණ දෝෂ හැරුණු විට වෙනත් ඉල්ලීම් සම්බන්ධව සලකා බලනු නොලැබේ. අයදුම්පත්

පැහැදිලිව ද නිවැරදිව ද සම්පූර්ණ කළ යුතු ය. එසේ නොවන අයදුම්පත් සහ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.7 විභාගයට ඉදිරිපත් කරන සියලුම අයදුම්කරුවන් විසින් අයදුම්පතේ සඳහන් සම්පූර්ණ කර ඇති තොරතුරු පෞද්ගලිකව පරීක්ෂා කර බලා අත්සන් කළ යුතු අතර සියලු අයදුම්කරුවන්ගේ ජාතික හැඳුනුම්පතේ පිටපතක් විභාග ප්‍රතිඵල නිකුත් කරන තෙක් දහම් පාසල් ප්‍රධානාචාර්යවරයා ළඟ තබා ගත යුතු වේ.

5.8 අයදුම්කරුවන්ගේ අදාළ සහතික පිළිබඳවත්, සුදුසුකම් ලබා තිබීම පිළිබඳවත්, අයදුම්පත් සහතික කරන ප්‍රධානාචාර්යවරයා වගකිව යුතු ය.

5.9 දහම් පාසලේ ලියාපදිංචි අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. දහම් පාසලේ ලිපිනය වෙනස් වී නම් එය දැන්විය යුතු අතර දහම් පාසලේ ප්‍රධානාචාර්යවරයා සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකය ද සඳහන් කරන්න. සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් **විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල** ලිපිනයට ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ. අයදුම්පත බහා එවන කවරයේ වමත් පස කෙළවරේ **"බෞද්ධ ධර්මාචාර්ය සහතික පත්‍ර විභාගය - 2026"** යනුවෙන් ද ඉල්ලුම් කරන නගරය ද සඳහන් කළ යුතුය.

5.10 තැපෑලේ දී යම් අයදුම්පතක් නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලබන අතර අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් පිළිබඳ වගකීම දහම් පාසල් ප්‍රධානීන් විසින් භාර ගත යුතු ය.

06. විභාග ගාස්තු :- මෙම විභාගය සඳහා නියමිත විභාග ගාස්තුව රු. 200කි. එහෙත් ප්‍රථම වතාවට ඉදිරිපත් වන දහම් පාසල් අයදුම්කරුවන් මෙම විභාග ගාස්තුවෙන් නිදහස් කරනු ලැබේ. ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කිරීම සඳහා විභාග ගාස්තුව රු. 50/-කි.

6.1 විභාග ගාස්තු ගෙවීම : අදාළ දහම් පාසලේ ප්‍රධානාචාර්යවරයා විසින් ගාස්තු ගෙවිය යුතු සියලුම අයදුම්කරුවන්ගේ විභාග ගාස්තු එකතු කර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආදායම් ශීර්ෂ අංක **20-03-02-13**ට බැරවන සේ දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට එම සම්පූර්ණ මුදල ගෙවා කුවිතාන්සිය ලබාගෙන එම කුවිතාන්සිය අයදුම්පතේ පසු පිටේ නොගැලවෙන සේ අලවා එවිය යුතු ය. කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

6.2 කුමන කරුණක් නිසාවත් මෙම විභාගය සඳහා ගෙවන ගාස්තු වෙනත් විභාගයකට මාරු කිරීම හෝ ආපසු ගෙවීම හෝ සිදු කරනු නොලැබේ.

07. ප්‍රවේශ පත්‍ර :- විභාගයට ඇතුළත් කර ගන්නා සෑම අයදුම්කරුවකු වෙතම විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍රයක්, අයදුම්පත් ඉදිරිපත් කළ දහම් පාසලේ ප්‍රධානාචාර්යවරයා වෙත නිකුත් කරනු ඇත.

7.1 විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවකු විසින්ම ස්වකීය විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගෙන විභාගයට පෙනී සිටින ප්‍රථම අවස්ථාවේ දී ම විභාග ශාලාධිපති වෙත භාර දිය යුතු ය. යම් අයදුම්කරුවකු තම විභාග ප්‍රවේශ පත්‍රය භාර නොදී සිටී නම් හා විභාග කොමසාරිස් ජනරාල් විසින් තමාට නියම කරන විභාග මධ්‍යස්ථානය හැර වෙනත් විභාග මධ්‍යස්ථානයක දී විභාගයට පෙනී සිටී නම් ඔහුගේ හෝ ඇයගේ හෝ විභාග අපේක්ෂකත්වය අහෝසි කරනු ඇත.

7.2 විභාග ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන, දහම් පාසල අයත් විහාරස්ථානයේ විහාරාධිපති හිමි හෝ දහම් පාසලේ ප්‍රධානාචාර්යවරයා හෝ ග්‍රාම නිලධාරී හෝ විසින් සහතික කළ යුතු ය.

7.3 විභාගය පැවැත්වීමට දින 07කට පෙර විභාග ප්‍රවේශ පත්‍ර නොලැබුණහොත් එම දහම් පාසලේ ප්‍රධානාචාර්යවරයා විසින් ඒ බව නොපමාව විභාග කොමසාරිස් ජනාරල් වෙත දැන්විය යුතු ය. එවැනි සෑම අවස්ථාවකම පහත සඳහන් විස්තර සැපයිය යුතු ය.

1. විභාගයේ නම
2. දහම් පාසලේ නම හා දුරකථන අංකය
3. දහම් පාසලට ලබාදී ඇති පරිගණක අංකය
4. අයදුම්කරුගේ සම්පූර්ණ නම
5. අයදුම් කළ විභාග මධ්‍යස්ථානය/ නගරය
6. අයදුම්පත තැපැල් කළ තැපැල් කාර්යාලය
7. අයදුම්පත ලියාපදිංචි කළ කුවිතාන්සිය
8. විභාග ගාස්තු ගෙවූ ලදුපත් පිටපත

08. අනන්‍යතාව :- විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

❖ ජාතික හැඳුනුම්පත
❖ වලංගු විදේශ ගමන් බලපත්‍රය
❖ වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

09. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

10. සමත් බව තීරණය කිරීම හා ප්‍රතිඵල නිකුත් කිරීම :- මෙම විභාගය සඳහා නියමිත විෂයයන් ගණන පහක් වන අතර, විභාගයෙන් සාමාර්ථය ලැබීම සඳහා සෑම විභාග අපේක්ෂකයකුම එම විෂයයන් පහෙන්ම සමත් විය යුතු ය. කෙසේ වෙතත් එක් වතාවක දී අදාළ විෂයයන් පහෙන් එක් විෂයයක් පමණක් අසමත් නම් එය ඌන සාමාර්ථයක් ලෙස සලකනු ලැබේ. ඌන සාමර්ථය ලබාගත් වර්ෂයේ සිට අනුගාමී විභාග අවස්ථා තුනක් (03) ඇතුළත එම ඌන සාමර්ථ්‍යය ලැබූ විෂයය සඳහා නැවත පෙනී සිට එය සමත් වී ඌන සාමාර්ථය සම්පූර්ණ කළ හැක. ඌන සාමාර්ථය ලබන සිසුන් ඌන සාමර්ථය සම්පූර්ණ කිරීමේ දී විභාගයට පෙනී සිටිය යුත්තේ අනිවාර්යයෙන්ම ඌන සාමර්ථය ලැබූ විෂයයට පමණි. එක් විෂයයකට වඩා අසමත් වී ඇත්නම් සම්පූර්ණ විභාගය සඳහා පෙනී සිටිය යුතු වේ. යම්කිසි අපේක්ෂකයකු ඌන සාමාර්ථය සම්පූර්ණ කර ඇත්නම් ඒ බව විභාගයේ ප්‍රතිඵල නිකුත් කර තෙමසක් ඉකුත්වීමට පෙර නියෝජ්‍ය විභාග කොමසාරිස් (ආයතනික විභාග ප්‍රතිඵල) වෙත ලියා දැන්විය යුතුය.

10.1 සෑම විෂයයකම එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 100ක් හිමිවන අතර, සමත් වීමේ ශ්‍රේණිවලට අදාළ ලකුණු පරාස සහ සංකේත පහත දැක්වේ.

| *ලකුණු පරාසය* | *ශ්‍රේණිය* | *සංකේතය* |
|---|---|---|
| 0-34 | අසමත් | F |
| 35-54 | සමත් | S |
| 55-69 | සම්මාන | C |
| 70-100 | විශිෂ්ට සම්මාන | D |

10.2 අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ලැයිස්තුව අදාළ දහම් පාසල් ප්‍රධානීන් වෙත තැපැල් මඟින් එවනු ලැබේ.

10.3 විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

11. සහතික පත්‍ර :- මෙම විභාගයෙන් සමත් වන සෑම අයදුම්කරුවකුටම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් සහතික පත්‍රයක් නිකුත් කිරීමට විධිවිධාන යොදනු ලැබේ. අදාළ සහතික පත්‍ර දහම් පාසල් ප්‍රධානාචාර්යවරුන් වෙත තැපැල් මඟින් ලබා දෙනු ඇත. විභාගය සමත්ව එහෙත් සහතික පත්‍රයක් නොලැබුණ යම් අපේක්ෂකයකු වේ නම්, ඒ පිළිබඳව දහම් පාසල් ප්‍රධානාචාර්ය මඟින් විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග ප්‍රතිඵල ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයෙන් ලිඛිතව විමසීම් කළ යුතු ය.

12. උත්තර පත්‍ර නැවත සමීක්ෂණය :- දහම් පාසල් ප්‍රධානාචාර්යවරුන්ගේ ඉල්ලීම මත පමණක් උත්තර පත්‍ර නැවත සමීක්ෂණයට ඉඩදෙනු ලැබේ. විභාග දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරනු ලබන ආකෘති පත්‍රයකින්, විභාග ප්‍රතිඵල නිකුත් වී දින 30 ක් ඇතුළත නැවත සමීක්ෂණය සඳහා ඉල්ලුම් කළ හැකිය. මේ සඳහා වන ගාස්තු ප්‍රමාණයන් වරින් වර සංශෝධනය වීමට ඉඩ ඇති බැවින් එය අදාළ අයදුම්පතෙහි දක්වනු ලැබේ. කවර හේතුවක් නිසාවත් අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට හෝ උත්තර පත්‍ර පරීක්ෂා කිරීමට ඉඩදෙනු නොලැබේ.

13. විෂය නිර්දේශය :- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් සංවිධානය කර පැවැත්වීමට නියමිත බෞද්ධ ධර්මාචාර්ය සහතික පත්‍ර විභාගයට අදාළ විෂය නිර්දේශය උපලේඛන 02 ලෙස මෙම නිවේදනය අවසානයේ දක්වා ඇත.

14. මෙම නිවේදනයේ දක්වා ඇති විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීමට සියලුම විභාග අයදුම්කරුවන් බැඳී සිටින අතර, මෙහි විධිවිධාන සලසා නැති කවර හෝ යම් කරුණක් වෙතොත් එය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි තීරණය වනු ඇත.

**ඒ.කේ.එස්. ඉන්දිකා කුමාරි ලියනගේ,**
විභාග කොමසාරිස් ජනරාල්.

2026 අගෝස්තු මස 17 වැනි දින,
බත්තරමුල්ල,
පැලවත්ත,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

**01 උපලේඛනය**

**ඒ ඒ දිස්ත්‍රික්කයන් හි විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර සහ නගර අංක**

| දිස්ත්‍රික්කය / නගරය | දිස්ත්‍රික් / නගර අංකය |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |

| දිස්ත්‍රික්කය / නගරය | දිස්ත්‍රික් / නගර අංකය |
|---|---|
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| වවුනියාව | 12 |
| මුලතිව් | 13 |
| කිළිනොච්චිය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 20 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොනරාගල | 23 |
| රත්නපුර | 24 |
| කෑගල්ල | 25 |

## 02 උපලේඛනය

විෂය නිර්දේශය

ථෙරවාදී බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම්

01. චතුරාර්ය සත්‍යය
02. ත්‍රිලක්ෂණය
03. ඛන්ධ,ආයතන, ධාතු විභාගය
04. පටිච්චසමුප්පාදය
05. කර්ම විභාගය
06. කුසලාකුසල විනිශ්චය
07. සත්තිස් බෝධි පාක්ෂික ධර්ම
08. නිර්වාණය
09. නිර්වාණගාමී මාර්ගය
10. භාවනා ( සමථ - විදර්ශනා භාවනා )

බෞද්ධ විනය මාර්ගය හා පාලි භාෂා පරිචය

I කොටස : බෞද්ධ විනය මාර්ගය

බෞද්ධ භික්ෂු සමාජයේ ප්‍රභවය හා සංවර්ධනය
පබ්බජ්ජා සහ උපසම්පදා
ගුරු - ශිෂ්‍ය සම්බන්ධය
විනය නීති පැනවීමේ මූලික පරමාර්ථ
භික්ෂු ප්‍රාතිමෝක්ෂය
උපෝසථ කර්මය
වස් විසීම
පවාරණය
කඨිනය
බෞද්ධ අධිකරණ ක්‍රම
දණ්ඩ කම්ම
ගිහි - පැවිදි සම්බන්ධය

II කොටස : සූත්‍ර ධර්ම

සිගාලෝවාද සූත්‍රය
ව්‍යග්ඝපජ්ජ සූත්‍රය
පරාභව සූත්‍රය
ධම්මික සූත්‍රය
මංගල සූත්‍රය යන සූත්‍ර පිළිබඳ සාමාන්‍ය අවබෝධය

III කොටස : පාලි - ( ධම්මපදය )
යමක වග්ග ( 03, 04, 05 ගාථා )
චිත්ත වග්ග ( 10, ගාථාව )
පුප්ඵ වග්ග ( 06, 07, ගාථා )
බාල වග්ග ( 02, 08, ගාථා )
පණ්ඩිත වග්ග ( 05, 06, ගාථා )
අරහන්ත වග්ග ( 10, ගාථාව )
සහස්ස වග්ග ( 01, 02 ගාථා )
පාප වග්ග ( 01, 04 ගාථා )
දණ්ඩ වග්ග ( 01, 02 ගාථා )
ජරා වග්ග ( 01, 02, 03, 04, ගාථා )
බුද්ධ වග්ග ( 10, 11 ගාථා )
සුඛ වග්ග ( 01, 02 ගාථා )
ඉහත ගාථාවල අර්ථ දැක්වීම, විස්තර විභාගය හා නිදාන කතාව දැක්වීම

IV කොටස : පාලි - ( ජාතක කථා )
සාලිකෙදාර ජාතකය
සත්තිගුම්බ ජාතකය
තිත්තිර ජාතකය
මහාකපි ජාතකය
මාතිපෝසක ජාතකය
මණිකණ්ඨ ජාතකය
ඉහත ජාතක කතා පාලියෙන් සිංහලටත් සිංහලෙන් පාලියටත් පරිවර්තනය කිරීම

අභිධර්මය

**1 පරිච්ඡේදය අභිධර්මයේ ප්‍රභවය හා සංවර්ධනය**
**2 පරිච්ඡේදය විවිධ අභිධර්ම සම්ප්‍රදායයෝ**
**3 පරිච්ඡේදය අභිධර්ම සාහිත්‍යය**
**4 පරිච්ඡේදය සංඛත - අසංඛත ධර්ම**
**5 පරිච්ඡේදය සතර පරමාර්ථ පිළිබඳ ලක්ෂණ කථනය**
**6 පරිච්ඡේදය භෞතික ලෝකය පිළිබඳ බෞද්ධ විග්‍රහය**
**7 පරිච්ඡේදය කය හා සිත පිළිබඳ බෞද්ධ විවරණය**
**8 පරිච්ඡේදය සිතෙහි ස්වභාවය සහ ක්‍රියාකාරිත්වය**
**9 පරිච්ඡේදය සිත කිලිටිවීම**
**10 පරිච්ඡේදය සිත පිරිසිදු කරගැනීම**

බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

**01. භාරතීය බෞද්ධ නිකායන්ගේ ප්‍රභවය**
**02. ධර්මාශෝක අධිරාජයා : බෞද්ධ ආභාසය**
**03. ධර්මාශෝක අධිරාජයා : රාෂ්ට්‍ර පාලනය**
**04. ධර්මාශෝක අධිරාජයා : බුදුසමයේ දේශාන්තර ව්‍යාප්තිය**
**05. කණිෂ්ක රජතුමා**
**06. මහායාන බුදුසමයේ ප්‍රභවය**
**07. මහායාන බුදුසමයේ මූලික ඉගැන්වීම්**
**08. බෝධිසත්ව ධර්මය**
**09. බෞද්ධ විශ්වවිද්‍යාල - I**
**10. බෞද්ධ විශ්වවිද්‍යාල - II**
**11. භාරතීය බෞද්ධ පඬිවරු**
**12. බුදුසමයේ දේශාන්තර ව්‍යාප්තිය - I ( බුරුමය, තායිලන්තය, කාම්බෝජය, මධ්‍ය ආසියාව )**
**13. බුදුසමයේ දේශාන්තර ව්‍යාප්තිය - II ( චීනය, කොරියාව, ජපානය )**
**14. ප්‍රාග් මහින්ද යුගයේ ශ්‍රී ලංකා සංස්කෘතිය**
**15. මිහිඳු මාහිමියන් හඳුන්වා දුන් බුදුසමය**
**16. බුදුසමය සහ රජය අතර සබඳතාව**
**17. ශ්‍රී ලංකා සංස්කෘතිය කෙරෙහි බුදුසමයේ ආභාසය**
**18. ලක්දිව නිකාය භේදය**
**19. බුදු පිළිමය**
**20. බෞද්ධ ස්තූපය**

බෞද්ධ සමාජ දර්ශනය

01. සමාජ දර්ශනය, එහි ස්වභාවය සහ කාර්යය
02. බෞද්ධ සමාජ සංකල්පය
03. පුද්ගලයා සහ සමාජය
04. සමාජ සංස්ථාවන්ගේ ප්‍රභවය සහ පරිණාමය
05. ජීව -අජීව පරිසරය
06. ජාතිවාදය සහ සමාජ ස්තරායණය
07. බෞද්ධ දේශපාලන චින්තනය
08. මානව අයිතිවාසිකම්
09. බුදුදහමේ ආර්ථික චින්තනය
10. නීතිය,යුක්තිය සහ දණ්ඩනය
11. යුද්ධය හා සාමය
12. විවාහ ජීවිතය
13. සාමයික සහජීවනය
14. විද්‍යාව,තාක්ෂණය සහ කාර්මීකරණය
15. ජනගහනය හා සංවර්ධනය

08 - 280

---

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරින් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2026 නොවැම්බර් මස කොළඹ දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙමි.

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications- Recruitment/E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. **මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2026 අගෝස්තු මස 24 වැනි දින පෙ.ව. 9.00ට විවෘත වන අතර 2026 සැප්තැම්බර් මස 18 වැනි දින ප.ව. 9.00 ට අවසන් වේ.** අයදුම්පත් මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතෙහි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර, අදාළ ආයතන ප්‍රධානියා වෙත භාරදිය යුතු ය.

02. මෙම විභාගයට අදාළ විෂය නිර්දේශය හා අනෙකුත් විධි විධාන අංක 1928/28 දරන 2015.08.21 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ කර ඇත. පහසුව සඳහා එම විෂය නිර්දේශය සහ අනෙකුත් විධිවිධාන පහත දක්වා ඇත.

03. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. අධ්‍යාපන ප්‍රතිපත්ති | කාලය පැය 02 | 100 | 50 |
| 2. විෂයානුබද්ධ අධ්‍යයනය | කාලය පැය 02 | 100 | 50 |

04. විභාගය පවත්වනු ලබන බලධාරියා : විභාග කොමසාරිස් ජනරාල්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. අධ්‍යාපන ප්‍රතිපත්ති | මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ.<br>(අ) සාමාන්‍ය අධ්‍යාපන ප්‍රතිපත්තිය - රජය විසින් නිකුත් කරන ලද කාලීන අධ්‍යාපන ප්‍රකාශ පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා ප්‍රශ්න සකස් කරනු ලැබේ. ප්‍රතිපත්තීන්හි ප්‍රකාශිත වෙනස් කිරීම් වලින් තම රාජකාරි සේවයෙහි ඇති විය හැකි ගැටලු පිළිබඳව අපේක්ෂකයන්ගේ දැනුම පරීක්ෂා කර බැලීම අපේක්ෂා කෙරේ<br>(ආ) පාසල් විෂය මාලාව - පාසල් පද්ධතියේ විවිධ අදියරයන්හි විෂයමාලා ක්ෂේත්‍රය පිළිබඳව හා විෂය මාලාවේ මූලික අරමුණු පිළිබඳ අපේක්ෂකයාගේ සාමාන්‍ය අවබෝධය පරීක්ෂා කිරීම. පාසල්හි මානව හා භෞතික සම්පත් ආදිය ගැන අපේක්ෂකයන්ට අවබෝධයක් තිබිය යුතු අතර එම දෘෂ්ටි කෝණයෙන් විෂය මාලාව පිළිබඳව විවේචනාත්මකව අදහස් ඉදිරිපත් කිරීමට හැකිවිය යුතු ය. |
| 2. විෂයානුබද්ධ අධ්‍යයනය | අපේක්ෂකයාගේ නිර්මාණාත්මක හා තර්කානුකූල චින්තන ශක්තිය හා ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් කෙරෙන ප්‍රශ්න පත්‍රයකි. |

06. නිලධාරියකුට දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට නියමිත විෂයයන් සඳහා එකම වතාවක දී හෝ වෙන වෙනම අවස්ථා කිහිපයකදී හෝ පෙනී සිටිය හැකි ය.

07. විභාගයේ භාෂා මාධ්‍යය :

(i.) මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයන්ගෙන් පැවැත් වේ.

(ii.) අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් පමණක් විභාගයට පෙනී සිටිය යුතු ය.

(iii.) අපේක්ෂකයා රාජ්‍ය සේවයට ඇතුළුවීම සඳහා පෙනී සිටි තරග විභාගයේ භාෂා මාධ්‍යය හෝ තරග විභාගයක් නොමැතිව රජයේ සේවයට බැඳුණු අය සම්බන්ධයෙන් රජයේ සේවයට ඇතුළුවීමට සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් පිළිතුරු ලිවිය යුතු ය.

(iv.) අපේක්ෂකයකු තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටින බැව් හෙළිවුව හොත් ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

08. මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශවීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත

පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙම විභාගය සඳහා විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන් ඉදිරිපත් වන්නේ නම් ඒ බව අයදුම්පතේ අනිවාර්යයෙන් සඳහන් කළ යුතු අතර අදාළ වෛද්‍ය සහතිකවල පිටපත් අයදුම්පතේ මුද්‍රිත පිටපතක් සමග විභාග කොමසාරිස් ජනරාල් වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

09. ව්‍යාජ තොරතුරු සැපයීම - අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

10. විභාග ගාස්තු:

(අ) පළමු වරට අයදුම් කිරීමේ දී ගාස්තු අය කරනු නොලැබේ. ඊට පසු එක් එක් වතාව සඳහා එක් විෂයයකට රු. 600.00 ක් බැගින් අය කරනු ලැබේ.

(ආ) පළමු වරට විභාගයට අයදුම් කරන බවට සාවද්‍ය ලෙස සඳහන් කර ගාස්තු නොගෙවා විභාගයට පෙනී සිට ඒ බව අනාවරණය වීමෙන් පසු ගනු ලබන ක්‍රියාමාර්ගයන්ගේ අහිතකර ප්‍රතිඵල නිලධාරියා විසින් විඳ දරා ගත යුතු වේ.

විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය.

(i.) ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින්,

(ii.) අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින්,

(iii.) ලංකා බැංකු මාර්ග ගත බැංකු ක්‍රමය/ Flex යෙදවුම මගින්,

(iv.) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින්.

*සටහන :*

(අ) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

11. මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව නිවේදනයක් මගින්/ අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත හා විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපතෙහි ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතු ය. විභාග ශාලාවේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

*සටහන:* ඉහත 11 ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අයදුම්කරුවන් විසින් පසුව ඉදිරිපත් කරනු ලබන පැමිණිලි පිළිබඳව සලකා බලනු නොලැබේ.

12. විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතු ය.

13. අයදුම්කරුවකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු ය. විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවකුම විභාගයේ පළමු වැනි දින තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාරදිය යුතු ය. විධිමත් පරිදි තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

14. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ. විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය.

(i.) ජාතික හැඳුනුම්පත,

(ii.) වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ;

(iii.) වලංගු ශ්‍රී ලංකා රියදුරු බලපත්‍රය පමණක් පිළිගනු ලැබේ.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණු ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ නොමැති බව තහවුරු කර ගැනීමට හැකිවන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

15. මෙම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

16. විභාග ප්‍රතිඵල :

(i.) විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛන විභාග කොමසාරිස් ජනරාල් විසින් ලේකම්, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත.

(ii.) විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

17. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

18. මෙම නිවේදනය මගින් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු ය.

**නාලක කලුවැව,**
ලේකම්,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය.

2026 අගෝස්තු මස 11 වැනි දින,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය,
"ඉසුරුපාය"
බත්තරමුල්ල.

08-273

---

## ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය අධීක්ෂණ

**කළමනාකරණ සේවයේ (ස්ථිර මාර්ග/පාලම්/ගොඩනැගිලි/ කර්මාන්තශාලා/ධාවනාගාර/ සංඥා හා විදුලි) III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026**

**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය අධීක්ෂණ කළමනාකරණ සේවයේ පහත සඳහන් තනතුරුවල එම එක් එක් තනතුරට ඉදිරියෙන් දක්වා ඇති පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම සඳහා** 2026.09.21 දිනට මෙහි දක්වා ඇති සියලු සුදුසුකම් සපුරා ඇති වයස අවුරුදු 18ට වැඩි සහ 30ට නොවැඩි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | *තනතුරු නාමය* | *ශ්‍රේණිය* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|---|---|
| 1. | අධීක්ෂණ කළමනාකරු (ස්ථිර මාර්ග) | III ශ්‍රේණිය | 25 |
| 2. | අධීක්ෂණ කළමනාකරු (පාලම්) | III ශ්‍රේණිය | 3 |
| 3. | අධීක්ෂණ කළමනාකරු (ගොඩනැගිලි) | III ශ්‍රේණිය | 7 |
| 4. | අධීක්ෂණ කළමනාකරු (කර්මාන්තශාලා) | III ශ්‍රේණිය | 13 |

| | තනතුරු නාමය | ශ්‍රේණිය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 5. | අධීක්ෂණ කළමනාකරු (ධාවනාගාර) | III ශ්‍රේණිය | 15 |
| 6. | අධීක්ෂණ කළමනාකරු (සංඥා හා විදුලි) | III ශ්‍රේණිය | 20 |

02. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2026.09.21 වේ. සියලුම අයදුම්පත් එදිනට ප්‍රථම දුම්රිය සාමාන්‍යාධිකාරී, දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය, පත්වීම් ශාඛාව, තැ.පෙ. 355, ඕල්කට් මාවත, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කිසිම අයදුම්පතක් පුද්ගලික නමට එවීම හෝ අතින් ගෙනවිත් භාර දීම හෝ නොකළ යුතු ය. අසම්පූර්ණ, අවිධිමත්, අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති, නිසි පරිදි මුදල් ගෙවා නොමැති සහ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන් තම අයදුම්පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මඟින් නියමිත දිනට පෙර එවිය යුතු ය. මෙම තනතුරු සඳහා වන ලිඛිත තරග විභාගය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මඟින් පවත්වනු ලැබේ.

03. දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවා අවශ්‍යතාවේ ප්‍රමුඛත්වය මත පුරප්පාඩු සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් ඉහත දක්වා ඇති තනතුරුවලින් එක් තනතුරකට පත් කරනු ලබන අතර, පත්වීම් ලද පසු තනතුරු අතර මාරුවීම සඳහා අවසර දෙනු නොලැබේ.

**04. තනතුරේ රාජකාරි ස්වභාවය :**

අධීක්ෂණ කළමනාකරු (ස්ථිර මාර්ග) :

දුම්රිය ධාවනයට උචිත වන අන්දමින් දුම්රිය මාර්ග පද්ධතිය අලුතින් ඉදි කිරීම, අලුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම හා පවත්වා ගෙන යාමේ දී අධීක්ෂණ කළමනාකරුවකුගේ කාර්යභාරය ඉටු කිරීම.

අධීක්ෂණ කළමනාකරු (පාලම්) :

දුම්රිය ධාවනයට උචිත වන අන්දමින් දුම්රිය පාලම් පද්ධතිය අලුතින් ඉදිකිරීම, අලුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම හා පවත්වා ගෙන යාමේ දී අධීක්ෂණ කළමනාකරුවකුගේ කාර්යභාරය ඉටු කිරීම.

අධීක්ෂණ කළමනාකරු (ගොඩනැගිලි) :

ගොඩනැගිලි හා ව්‍යුහයන් අලුතින් ඉදි කිරීම, අලුත්වැඩියා කිරීම හා පවත්වා ගෙන යාමේ දී අධීක්ෂණ කළමනාකරුවකුගේ කාර්යභාරය ඉටු කිරීම.

අධීක්ෂණ කළමනාකරු (ධාවනාගාර) :

දුම්රිය එන්ජින් හා රිය පෙට්ටි හා මැදිරිවල සිදුවන කාර්මික දෝෂ හඳුනාගෙන ඒවා අලුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම හා එම ගැල් හා මැදිරි සේවයේ යෙදවීමට පෙර ධාවනය කර පරීක්ෂා කර සහතික කිරීම එම කාර්යයන්ට අදාළ යන්ත්‍ර සූත්‍ර, අමතර කොටස් යනාදිය රැස් කර ඇති ගබඩා පවත්වා ගෙන යාම හා නඩත්තු කිරීම, කර්මාන්තශාලාවල අදාළ යන්ත්‍ර සූත්‍ර නඩත්තු කිරීම ආදී කටයුතුවල අධීක්ෂණ කළමනාකරුවකුගේ සියලු කාර්යභාරයන් ඉටු කිරීම.

අධීක්ෂණ කළමනාකරු (කර්මාන්තශාලා) :

දුම්රිය ධාවනයට උචිත වන අන්දමින් එන්ජින් ගැල් මැදිරි ඇතුළු අනෙකුත් යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම අදාළ පරිදි අවශ්‍ය අමතර කොටස් අලුතින් නිෂ්පාදනය කිරීම සහ අලුත්වැඩියාවෙන් පසුව එම දුම්රිය එන්ජින් මැදිරි ධාවනය කර සහතික කිරීම එම කාර්යයන්ට අදාළ යන්ත්‍ර සූත්‍ර, අමතර කොටස් යනාදිය රැස් කර ඇති ගබඩා පවත්වා ගෙන යාම හා නඩත්තු කිරීම, කර්මාන්තශාලාවල අදාළ යන්ත්‍ර සූත්‍ර නඩත්තු කිරීම ආදී කටයුතුවල අධීක්ෂණ කළමනාකරුවකුගේ සියලු කාර්යභාරයන් ඉටු කිරීම.

අධීක්ෂණ කළමනාකරු (සංඥා හා විදුලි) :

දුම්රිය ධාවනයට උචිත වන අන්දමින් සංඥා පද්ධතිය හා විදුලි සංදේශ ක්‍රම අලුතින් ඉදි කිරීම, අලුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම හා පවත්වාගෙන ගෙන යාමේ දී අධීක්ෂණ කළමනාකරුවකුගේ කාර්යභාරය ඉටු කිරීම.

**05. වැටුප් පරිමාණය :**

(i) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව, රු. 57,810 - 5 X 890 - 5 X 1030 – 10 X 1,300 – 10 X 1,340 – 93,810/- ක් වන අතර, රු. 57,810 /-ක ආරම්භක වැටුප් තලයේ තබා ගෙවීම් කරනු ලැබේ.

(ii) මීට අමතරව රාජ්‍ය සේවකයන් සඳහා මූලික වැටුපට අමතරව ගෙවනු ලබන අනෙකුත් දීමනා සඳහා ද හිමිකම් ඇත.

(iii) අසනීප වී රෝහල් ගත වීමට සිදුවන අවස්ථාවල දී 'අග්‍රහාර' රක්ෂණාවරණය යටතේ වැය වූ මුදල ප්‍රතිපූරණය කර ගැනීමට හැකිය.

(iv) සේවා අවශ්‍යතාව අනුව නිල නිවාස ලබා ගැනීමට හිමිකම් පවතී.

**06. (අ) අධ්‍යාපන සුදුසුකම් :**

(i) සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමර්ථ්‍යක් සහිතව එකවර විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් ව තිබීම;

*සහ*

(ii) ව්‍යවහාරික ගණිතය, ශුද්ධ ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විද්‍යා/ගණිත විෂය ධාරාවන්ට අයත් විෂයයන් තුනකින් අ.පො.ස. (උසස් පෙළ) විභාගය එකවර සමත් වීම.

(ආ) වෘත්තීය සුදුසුකම් :

(i) මොරටුව විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව;

*හෝ*

(ii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව;

*හෝ*

(iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් පිරිනමනු ලබන උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව;

*හෝ*

(iv) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව;

*හෝ*

(v) තෘතික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිරිනමනු ලබන තනතුරට අදාළ ක්ෂේත්‍රයක ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම.

(අදාළ ක්ෂේත්‍රයන් පහත පරිදි විය යුතු ය)

(i) දුම්රිය අධීක්ෂණ කළමනාකරු (ස්ථිර මාර්ග) / දුම්රිය අධීක්ෂණ කළමනාකරු (ගොඩනැගිලි) / දුම්රිය අධීක්ෂණ කළමනාකරු (පාලම්) - සිවිල් විෂය ක්ෂේත්‍රය යටතේ අදාළ සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

(ii) දුම්රිය අධීක්ෂණ කළමනාකරු (කර්මාන්තශාලා) / දුම්රිය අධීක්ෂණ කළමනාකරු (ධාවනාගාර) - යාන්ත්‍රික / විදුලි හා ඉලෙක්ට්‍රොනික විෂය ක්ෂේත්‍රය යටතේ අදාළ සුදුසුකම සම්පූර්ණ කර තිබිය යුතු ය.

(iii) දුම්රිය අධීක්ෂණ කළමනාකරු (සංඥා හා විදුලි සංදේශ) : විදුලි හා ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ විෂය ක්ෂේත්‍රය යටතේ අදාළ සුදුසුකම සම්පූර්ණ කර තිබිය යුතු ය.

(ඇ) වෙනත් සුදුසුකම් :

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් ද යුක්ත විය යුතු ය.

(iii) සේවයට බඳවාගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණකර තිබේ නම් පමණි.

07. බඳවා ගැනීමේ ක්‍රමය :

(i) ඉහත (06) දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර බඳවා ගනු ලැබේ. ඉහත පළමු ඡේදය යටතේ වන වගුවේ දැක්වෙන පුරප්පාඩු පමණක් පුරවන අතර පොරොත්තු ලේඛනවල තබා බඳවා ගැනීමක් සිදු නොකරයි.

(ii) විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත;
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය,

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන

උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කිරීම සඳහා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරින්ට අයදුම්කරු හඳුනා ගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

(iii) අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

**08. තේරීමේ පටිපාටිය :**

ලිඛිත පරීක්ෂණයේ ලකුණු 40% ක් බැගින් හෝ ඊට වැඩියෙන් ලබාගත් අයදුම්කරුවන් පරීක්ෂණය සමත් වූ අය සේ සලකනු ලැබේ. ලකුණු ලබාගත් අනුපිළිවෙළ මත පෙළගස්වා පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් මූලික සුදුසුකම් සපුරා ඇති අය අතුරෙන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර තෝරා ගනු ලැබේ.

**09.** ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය අධීක්ෂණ කළමනාකරණ සේවයේ (ස්ථිර මාර්ග/පාලම්/ගොඩනැගිලි/ කර්මාන්තශාලා/ධාවනාගාර/ සංඥා හා විදුලි) III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන විවෘත ලිඛිත තරග විභාගය පිළිබඳ විස්තර :

(i) විභාග පරිපාටිය සහ විෂයය නිර්දේශය
මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ.

1. බුද්ධි පරීක්ෂණය
2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය

(ii) පරීක්ෂණ ක්‍රමය :

1. බුද්ධි පරීක්ෂණය
කාලය පැය 01 ලකුණු 100
2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය
කාලය පැය 03 ලකුණු 100

(ලිඛිත ප්‍රශ්න පත්‍රය සඳහා සමත් ලකුණු ප්‍රමාණය 40% වේ.)

(a) විෂය නිර්දේශය :

**විෂයය අංක 01 බුද්ධි පරීක්ෂණය :**

අපේක්ෂකයාගේ තර්කානුකූල විවරණ සහ විග්‍රහ ශක්තිය හා නිවැරදිව සිද්ධි අනුමානයන්ට එළඹීමේ හැකියාව, සාමාන්‍ය දැනුම හා බුද්ධිය පිළිබඳව මැනීමක් කිරීම අරමුණු කොට ගෙන මෙය සම්පාදනය කරනු ලැබේ. මෙය ගණිත ගැටලු, සාමාන්‍ය දැනීම, පරිසරය හා ආශ්‍රිත ප්‍රශ්න ඇතුළත් බහුවරණ ප්‍රශ්න පත්‍රයකි.

**විෂයය අංකය 02 විෂයානු බද්ධ තාක්ෂණික පරීක්ෂණය :**

බඳවා ගැනීමේ සුදුසුකම් ලෙස දක්වා ඇති ඉංජිනේරු ඩිප්ලෝමා සහතිකය හෝ සමාන සහතිකලාභියෙකු සතුව පැවතිය යුතු තාක්ෂණික දැනුම මට්ටම් හා ඉදි කිරීමේ හා නඩත්තු ක්ෂේත්‍රයේ දී භාවිත කරනු ලබන නවීන යන්ත්‍ර සූත්‍රවල ක්‍රියාකාරීත්වය පිළිබඳව ඇති දැනුම පරීක්ෂා කෙරෙන ආකාරයේ ප්‍රශ්න ඇතුළත් කෙරෙනු ඇත.

(b) විභාග පරිපාටිය : විභාග මාධ්‍යය

(අ) මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පැවැත්වේ.
(ආ) අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් පෙනී සිටිය හැකිය.

*සටහන :*

(1) අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ එක් භාෂාවකින් පමණි.
(2) අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.
(3) සෑම අපේකෂකයකුටම ප්‍රශ්න පත්‍ර දෙක (02)ටම පෙනී සිටිය යුතු ය.
(4) වරකදී බඳවා ගනු ලබන සංඛ්‍යාව දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් තීරණය කරනු ලැබේ.

10. අයදුම්පත සම්පූර්ණ කිරීමට උපදෙස් :

(i) අයදුම්පත A4 (යතුරු ලියන කඩදාසි) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් පිළියෙල කළ යුතු ය.
(අයදුම්පත තම අත් අකුරින් සම්පූර්ණ කළ යුතු යි)
අයදුම්පතේ :
1 වැනි පිටුවේ 01 සිට 06 තෙක් කරුණු ද,
2 වැනි පිටුවේ 07 සිට 12 තෙක් කරුණු ද,
3 වැනි පිටුවේ අත්සන සහතික කිරීම හා දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ සහතිකය ද ඇතුළත් විය යුතු ය.

ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත් සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු ය. එසේ නොවුණහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වනු ඇත. අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය වේ.

(ii) අදාළ ලිඛිත විභාගය සඳහා ගාස්තුව රු. 1,200/- කි. එය මහජන බැංකුවේ නගර මධ්‍ය ශාඛාවේ දුම්රිය සාමාන්‍යාධිකාරිගේ ගිණුම් අංක 176-1-001-2-9027313 ට බැරකර අදාළ ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇමිණිය යුතු ය. මෙම ලදුපතෙහි ඡායා පිටපත් ඉදිරිපත් කිරීම හෝ වෙනයම් ආකාරයටකට මුදල් ගෙවීම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වේ. තව ද, පරීක්ෂණ ගාස්තු ගෙවා ලබා ගත් ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් නොකරනු ලැබේ.

(iii) අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය අධීක්ෂණ කළමනාකරණ සේවයේ තනතුරු සඳහා බඳවා ගැනීම - 2026" යන්න සඳහන් කරන්න.

(iv) බාහිර අයදුම්කරුවන්ගේ අයදුම්පත්වල අත්සන සහතික කිරීම.
අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. කිසියම් ආයතනයකින් මෙම යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට ඉල්ලුම්කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරියෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු, රු. 240,360/- ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

(v) දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු පුද්ගලයන්ගේ අත්සන තම ආසන්නතම සේවා ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතු ය. මොවුන්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානින් මගින් එවීම අනිවාර්ය වේ.

(vi) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත ඉදිරිපත් කර පරීක්ෂණයට පෙනී සිටින අයදුම්කරුගේ අත්සන හා අත්සන සහතික කිරීම ද අදාළ නම් පමණක් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට්* නිවේදනය අනුව සුදුසුකම් තිබේ දැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

11. සේවා කොන්දේසි :

බඳවා ගනු ලබන්නේ දුම්රිය අධීක්ෂණ කළමනාකරණ සේවයේ III වැනි ශ්‍රේණියට වන අතර, නියමිත වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් පියවරේ තබනු ලැබේ.

12. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතුය. දැනටමත් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක වී ඇත්නම් තවදුරටත් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි විධිවිධාන අනුව රාජ්‍ය සේවයට බැඳුණු භාෂා මාධ්‍යයට අමතරව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාව ලබා ගත යුතු වේ.

(iii) තෝරාගනු ලබන අපේක්ෂකයින් ආයතන සංග්‍රහයේ සහ මුදල් රෙගුලාසිවල සඳහන්

විධිවිධානවලටත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ විධිවිධානවලටත් යටත්ව කටයුතු කළ යුතු ය. එමෙන්ම විටින් විට රජය විසින් නිකුත් කරන නියෝග දෙපාර්තමේන්තු උපදෙස්වලට යටත්ව කටයුතු කිරීමට බැඳී සිටියි.

(iv) බඳවා ගනු ලබන අයදුම්කරුවන් වෙත දෙපාර්තමේන්තුව මගින් අදාළ ක්ෂේත්‍රයේ පුහුණුවක් ලබා දෙන අතර, ඉන්පසු වසර 10ක සේවා කාලයක් සඳහා ගිවිස ගත යුතු ය. ගිවිසුම කඩ කළහොත් රු.1,000,000/-ක මුදලක් දෙපාර්තමේන්තුව වෙත ගෙවීමටත් අයදුම්කරු බැඳී සිටිය යුතු ය.

13. මෙම නිවේදනයෙන් අනාවරණය නොවන කිසියම් කරුණක් පිළිබඳව අවසාන තීරණය ගැනීමේ බලය දුම්රිය සාමාන්‍යාධිකාරි සතු වේ. දුම්රිය අධීක්ෂණ කළමනාකරණ සේවයේ බඳවා ගැනීමේ පටිපාටියේ සියලු විධිවිධාන මෙම නිවේදනයට අදාළ ය.

14. මෙම නිවේදනයේ සිංහල, දෙමළ මාධ්‍ය හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන වන අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇත්තේ නම් එවැනි විටක දී සිංහල භාෂාවෙන් වන නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කළ යුතු ය.

**රවීන්ද්‍ර පත්මප්‍රිය,**
දුම්රිය සාමාන්‍යාධිකාරි,
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව.

2026, අගෝස්තු මස 11 දින,
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව,
අංක 355, ඕල්කට් මාවත,
කොළඹ 10.

(මේ අනුව A-4 කඩදාසිවල දෙපසම භාවිත කරමින් පිළියෙල කරගත් අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර අයදුම්පත් කැඳවීමේ නිවේදනය කියවා හොඳින් වටහා ගත යුතු ය.)

**ආදර්ශ අයදුම්පත්‍රය**

**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය අධීක්ෂණ කළමනාකරණ සේවයේ (ස්ථිර මාර්ග/පාලම්/ගොඩනැගිලි/කර්මාන්තශාලා/ ධාවනාගාර/ සංඥා හා විදුලි) III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ තරඟ විභාගය - 2026**

**Competitive Examination for Recruitment for the Post In Railway Supervisory Management (Permanent Ways/ Bridges/ Buildings/Workshops/Locomotives/Signal and Telecommunications) Service Grade III – 2026**

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

*ඉල්ලුම් කරන තනතුර :*
..................................................

01. මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :
(i) සිංහලෙන්/දෙමළෙන් : ..............................................................................
(ii) ඉංග්‍රීසියෙන්: ..........................................................................................
(උදා: PERERA, R.M.D.)

02. මුලකුරු වලින් හැඳින්වෙන නම් :
(i) සිංහලෙන්/දෙමළෙන් : ..............................................................................
(iii) ඉංග්‍රීසියෙන්: ..........................................................................................

03. ස්ථිර ලිපිනය :
(i) සිංහලෙන්/දෙමළෙන් : ..........................................................................
(ii) ඉංග්‍රීසියෙන්: ............................................................................

04. ස්ත්‍රී/ පුරුෂ භාවය:

ස්ත්‍රී 1
පුරුෂ 0

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. ජාතික හැඳුනුම්පත් අංකය :

06. ජන වර්ගය :
සිංහල - 1/ ශ්‍රී ලංකා ද්‍රවිඩ - 2/ ඉන්දියා ද්‍රවිඩ 3
මුස්ලිම් - 4/ බර්ගර් - 5/ මැලේ - 6 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

07. පදිංචිය :
(i) ග්‍රාම නිලධාරි කොට්ඨාසය : .................................. එහි අංකය
(ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ...............................
(iii) දිස්ත්‍රික්කය : ............................................................

08. උපන් දිනය : වර්ෂය : මාසය : දිනය :

09. දුරකථන අංකය :

10. 2026..... . ... දිනට වයස : අවුරුදු : මාස : දින :

11. අධ්‍යාපන සුදුසුකම් :

(i) අ.පො.ස. (සා.පෙළ.) :

විභාග අංකය : ................................. වර්ෂය : ............................

| *අනු. අංකය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|
| (i) | | |
| (ii) | | |
| (iii) | | |
| (iv) | | |
| (v) | | |
| (vi) | | |
| (vii) | | |
| (viii) | | |
| (ix) | | |
| (x) | | |

(ii) අ.පො.ස. (උසස් පෙළ) :

විභාග අංකය : .................................... වර්ෂය : .................................

| *අනු අංකය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|
| (i) | | |
| (ii) | | |
| (iii) | | |
| (iv) | | |

(iii) වෘත්තීය සුදුසුකම් :
..........................................................................................................................................................
..........................................................................................................................................................

12. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේද? :

ඔව් ☐ නැත ☐

(අදාළ කොටුව තුළ “X” ලකුණ යොදන්න.)

13. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සහ/හෝ අසත්‍ය ලෙස සම්පූර්ණ කර තිබීමෙන් අපේක්ෂකත්වය අවලංගු වන බව හොඳින් දැන සිටිමි. ඉන් වන හානිය මම පුද්ගලිකව දරා ගනිමි.

(ආ) ඉහත (අ) හි දක්වා ඇති කරුණු අසත්‍ය බව මා තනතුරට පත්වීමෙන් පසුව හෙළිවුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් බව ද ප්‍රකාශ කරමි. ඉන් සිදුවන හානි වෙතොත් ඒවා ද මම පුද්ගලිකව දරා ගනිමි.

(ඇ) ..........................දින මහජන බැංකුවට 1200/-ක් ගෙවා ලබාගත් අංක ................. දරන ලදුපත මේ සමග අමුණා ඇත.

| *ලදුපත නොගැලවෙන සේ එහි එක් දාරයකින් අලවන්න.*<br>*(ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගන්න)* |
|---|

(ඈ) මෙම විභාගයේ කොන්දේසි පිළිපැදීමට එකඟ වෙමි.

(ඉ) තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

(ඊ) තව ද සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

**14. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :-**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන, ජාතික හැඳුනුම්පත් .......................................... දරන අංක................................. .............................................. මහතා මා පෞද්ගලිකව දන්නා බවත් ඔහු අද දින මා ඉදිරිපිට දී ඔහුගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

........................................................,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ නම : ..........................................................
තනතුර : ..........................................................
ලිපිනය : ..........................................................
දිනය : ..........................................................

**15.** දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ සහතිකය : (රාජ්‍ය සේවයේ නිරත අයදුම්කරුවන් සඳහා පමණි.)

මෙම අයදුම්පත ඉදිරිපත්කර ඇති ....................................... මහතා, ............................ දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ............................ දින සිට ...................... දක්වා .................................................. වශයෙන් සේවයකර ඇත. ඔහුට එරෙහිව නොනිමි විනය චෝදනා වාර්තා වී ඇත/ නැත. ඔහුගේ වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායකය/ අසතුටුදායකය. නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ඔහු දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සේවයේ තනතුරක් සඳහා තෝරා ගනු ලැබුවහොත් මෙම දෙපාර්තමේන්තුවෙන්/ ආයතනයෙන් මුදා හැරීමට හැකි/ නොහැකි බව දන්වනු කැමැත්තෙමි.

............................................,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය : .................................
සහතික කරන අයගේ සම්පූර්ණ නම : ...............................................
තනතුර : .....................................................
ලිපිනය : ....................................................
(කරුණාකර නිල මුද්‍රාව තබන්න)

08 - 243

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.